# 2 වැනි පරිච්ඡේදය

# ජාතික නිෂ්පාදිතය සහ වියදම

## 2.1 සමස්ත නිරීක්ෂණ

**දේශීය හා විදේශීය දෙපාර්ශවයෙන්ම එල්ල වූ අභියෝග මධ්‍යයේ 2009 වසර තුළ සියයට 3.5 ක ආර්ථික වර්ධනයක් අත්පත් කර ගනිමින්, ශ්‍රී ලංකා ආර්ථිකය කම්පනයන්ට ඔරොත්තු දීමේ තම නිසඟ හැකියාව ප්‍රදර්ශනය කළේය.** වසරේ දෙවන කාර්තුවේ සිට ආර්ථිකය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වෙමින් හතර වන කාර්තුවේ දී සියයට 6.2 ක ඉහළ ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම මෙම තත්ත්වයට හේතු විය. 2009 වසරේ මෙම වර්ධනය වාර්තා වූයේ ඊට පෙර වසර හතර තුළ දී අඛණ්ඩව අත්කරගත් සියයට 6.0 හෝ ඊට වැඩි ශක්තිමත් ආර්ථික වර්ධනයන් වාර්තා කර ගැනීමෙන් පසුවය. ලොව සියලු ප්‍රධාන ආර්ථිකයන්ගේ සිදු වූ අවපාතය, වසරේ ප්‍රථම භාගයේ දී රට තුළ පැවැති අභ්‍යන්තර ගැටුම් හේතු කොට ගෙන ආරක්ෂාව තර කිරීමට සිදු වීම මෙන්ම අයහපත් කාලගුණය නිසා කෘෂිකාර්මික අංශයේ ඇති වූ පසුබෑම, 2009 වසරේ දී මෙම ආර්ථික වර්ධනය අත්පත් කරගත් කාලය තුළ ආර්ථිකයට මුහුණ දීමට සිදු වූ ප්‍රධාන අභියෝගයන් විය. රට තුළ පැවැති අභ්‍යන්තර ගැටුම නිමා වීමෙන් පසුව ව්‍යාපාරික විශ්වාසය වර්ධනය වීම සහ ගෝලීය ආර්ථිකය ක්‍රමිකව යථා තත්වයට පත්වීම හේතු කොට ගෙන 2010 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධන ප්‍රගතිය තවදුරටත් වේගවත් වනු ඇතැයි අපේක්ෂිතය.

**වසරේ ප්‍රථම භාගය තුළ ආර්ථික වර්ධනය සඳහා ප්‍රධාන අංශ තුනම දායක වුව ද, උතුරු පළාත තුළ පැවැති ගැටුම් වර්ධනය වීම සහ ගෝලීය ආර්ථික අවපාතය එම කාලය තුළ කාර්මික සහ සේවා අංශවලට අහිතකර ලෙස බලපෑවේය.** මෙම කාලය තුළ සේවා අංශය සියයට 1.1 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කරන ලද අතර කාර්මික අංශයේ වර්ධනය සියයට 2.4 ක් විය. සියයට 3.7 ක වර්ධනයක් සනිටුහන් කරමින් කෘෂිකාර්මික අංශයේ ක්‍රියාකාරිත්වය ඉතා යහපත් වූ අතර මහ කන්නයේ ලැබූ සාර්ථක අස්වැන්න මෙම වර්ධනය කෙරෙහි විශේෂයෙන් දායක විය. කෙසේ වුව ද, තේ නිෂ්පාදනය පහත වැටීම වසරේ ප්‍රථම භාගය තුළ කෘෂිකාර්මික අංශයේ වර්ධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය.

**අභ්‍යන්තර ගැටුම නිමා වීම සහ ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ වසරේ දෙවන භාගය තුළ කාර්මික සහ සේවා අංශයන් යථා තත්ත්වයට පත්විය.** මෙම කාලය තුළ දී කාර්මික සහ සේවා අංශයන් පිළිවෙළින්, සියයට 5.9 ක සහ සියයට 5.4 ක වර්ධනය වේගයක් අත්පත් කර ගන්නා ලදී. වසරේ දෙවන භාගය තුළ අත්කරගත් මුළු ආර්ථික වර්ධනයට, ප්‍රධාන වශයෙන් හේතු වූයේ සේවා අංශය විසින් සපයන ලද සියයට 63 ක ඉහළ දායකත්වයයි. කෙසේ වුව ද, වසරේ ප්‍රථම භාගයේ වාර්තා කළ අඩු වර්ධනය හේතුවෙන් සේවා අංශයේ වාර්ෂික වර්ධනය, පෙර වසරේ ලබාගත් සියයට 5.6 ක වර්ධනයට සාපේක්ෂව සියයට 3.3 දක්වා අඩු විය. කාර්මික අංශය ද 2008 වසරේ වාර්තා කළ සියයට 5.9 ක වර්ධනයට සාපේක්ෂව 2009 වර්ෂයේ සියයට 4.2 ක අඩු වර්ධනයක් වාර්තා කළේය. මේ අතරතුර 2009 යල කන්නයේ වී නිෂ්පාදනයෙහි ඇති වූ තියුණු අඩු වීම වසරේ දෙවන භාගයේ කෘෂිකාර්මික අංශයේ වර්ධනය සියයට 2.6 දක්වා අඩු වීමට හේතු විය. ඒ අනුව, 2008 වසරේ කෘෂිකාර්මික අංශය අත්පත් කරගත් සියයට 7.5 ක

**2.1 සංඛ්‍යා සටහන**

**කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය සහ වර්ධනය (2002 ස්ථාවර මිල අනුව)**

| අංශය | වෙනස්වීමේ අනුපාතය (%) | | ද.දේ.නි.හි වෙනස්වීමේ දායකත්වය (%) | | ද.දේ.නි.යට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2008(අ) | 2009(ආ) | 2008(අ) | 2009(ආ) | 2008(අ) | 2009(ආ) |
| **කෘෂිකාර්මික** | 7.5 | 3.2 | 15.1 | 10.8 | 12.1 | 12.0 |
| 1 කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදී වන ද්‍රව්‍ය | 7.3 | 2.8 | 13.2 | 8.5 | 10.9 | 10.9 |
| 1.1 තේ | 4.2 | - 8.9 | 0.8 | - 2.9 | 1.2 | 1.0 |
| 1.2 රබර් | 10.3 | 7.9 | 0.4 | 0.5 | 0.2 | 0.3 |
| 1.3 පොල් | 5.2 | 5.2 | 1.2 | 2.0 | 1.4 | 1.4 |
| 1.4 සුළු අපනයන බෝග | - 2.1 | 5.2 | - 0.2 | 0.7 | 0.4 | 0.5 |
| 1.5 වී | 23.1 | - 5.1 | 6.1 | - 2.7 | 1.8 | 1.7 |
| 1.6 පශු සම්පත් | 5.6 | 6.2 | 0.8 | 1.5 | 0.9 | 0.9 |
| 1.7 අනෙකුත් ආහාර බෝග | 4.7 | 7.0 | 3.0 | 7.5 | 3.8 | 3.9 |
| 1.8 වතු සංවර්ධනය | 3.5 | 5.2 | 0.2 | 0.4 | 0.3 | 0.3 |
| 1.9 දැව සහ වන සම්පත් | 7.1 | 5.9 | 0.7 | 1.0 | 0.6 | 0.6 |
| 1.10 වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන | 2.1 | 4.9 | 0.1 | 0.5 | 0.4 | 0.4 |
| 2 ධීවර කර්මාන්තය | 9.9 | 6.9 | 1.8 | 2.2 | 1.1 | 1.2 |
| **කාර්මික** | 5.9 | 4.2 | 28.3 | 33.8 | 28.4 | 28.6 |
| 3 පතල් සහ කැනීම් | 12.8 | 8.2 | 4.1 | 4.7 | 2.0 | 2.1 |
| 4 නිෂ්පාදන කර්මාන්ත | 4.9 | 3.3 | 14.6 | 16.3 | 17.5 | 17.4 |
| 4.1 සැකසුම් (තේ, රබර් සහ පොල්) | 5.3 | 0.7 | 0.6 | 0.1 | 0.6 | 0.6 |
| 4.2 කර්මාන්තශාලා නිෂ්පාදන | 5.0 | 3.4 | 13.3 | 15.2 | 15.8 | 15.8 |
| 4.3 ගෘහ කර්මාන්ත | 4.5 | 3.3 | 0.8 | 1.0 | 1.1 | 1.1 |
| 5 විදුලිය, ගෑස් සහ ජලය | 2.7 | 3.7 | 1.1 | 2.5 | 2.4 | 2.4 |
| 5.1 විදුලිය | 3.9 | 3.7 | 1.4 | 2.2 | 2.1 | 2.1 |
| 5.2 ගෑස් | - 10.2 | 5.4 | - 0.3 | 0.3 | 0.2 | 0.2 |
| 5.3 ජලය | 3.6 | 2.9 | 0.1 | 0.1 | 0.1 | 0.1 |
| 6 ඉදිකිරීම් | 7.8 | 5.6 | 8.4 | 10.3 | 6.5 | 6.6 |
| **සේවා** | 5.6 | 3.3 | 56.6 | 55.4 | 59.5 | 59.3 |
| 7 තොග සහ සිල්ලර වෙළෙඳාම | 4.7 | - 0.3 | 19.4 | - 2.1 | 24.2 | 23.3 |
| 7.1 ආනයන වෙළෙඳාම | 4.7 | - 6.6 | 7.2 | - 16.8 | 9.0 | 8.1 |
| 7.2 අපනයන වෙළෙඳාම | 0.9 | - 5.2 | 0.7 | - 6.5 | 4.4 | 4.1 |
| 7.3 දේශීය වෙළෙඳාම | 6.4 | 7.0 | 11.5 | 21.1 | 10.8 | 11.1 |
| 8 හෝටල් සහ ආපනශාලා | - 5.0 | 13.3 | - 0.3 | 1.4 | 0.4 | 0.4 |
| 9 ප්‍රවාහනය සහ සන්නිවේදනය | 8.1 | 6.6 | 17.5 | 24.3 | 13.1 | 13.5 |
| 9.1 ප්‍රවාහනය | 6.3 | 6.0 | 11.5 | 18.5 | 10.9 | 11.1 |
| 9.2 භාණ්ඩ මෙහෙයවීම - වරාය සහ සිවිල් ගුවන් සේවා | 8.0 | 3.4 | 0.9 | 0.6 | 0.7 | 0.7 |
| 9.3 තැපැල් සහ විදුලි සංදේශ | 22.3 | 11.7 | 5.1 | 5.2 | 1.6 | 1.7 |
| 10 බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් යනාදිය | 6.6 | 5.7 | 9.5 | 14.0 | 8.7 | 8.9 |
| 11 නිවාස අයිතිය | 1.1 | 1.3 | 0.6 | 1.1 | 3.1 | 3.0 |
| 12 රාජ්‍ය සේවා | 5.7 | 5.9 | 7.4 | 12.8 | 7.7 | 7.8 |
| 13 පෞද්ගලික සේවා | 6.5 | 5.8 | 2.6 | 3.9 | 2.4 | 2.4 |
| **දළ දේශීය නිෂ්පාදිතය** | 6.0 | 3.5 | 100.0 | 100.0 | 100.0 | 100.0 |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | - 131.2 | 49.7 | | | | |
| **දළ ජාතික නිෂ්පාදිතය** | 4.6 | 4.8 | | | | |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වර්ධනයට සාපේක්ෂව 2009 වසරේ අත්පත් කරගත හැකි වූයේ සියයට 3.2 ක වර්ධනයක් පමණි. කෘෂිකාර්මික අංශයේ මෙම වර්ධනය පහත වැටීම කෙරෙහි මූලික වශයෙන් හේතු වූයේ ප්‍රධාන බෝග දෙකක් වූ තේ සහ වී වගාවන්වල සමස්ත ක්‍රියාකාරිත්වය දුර්වල වීම සහ 2008 වර්ෂයේ ඉහළ වර්ධනයක් වාර්තා වීමයි.

කාර්මික අංශයේ සියලුම ප්‍රධාන උප අංශයන් එහි වඩා යහපත් වූ ක්‍රියාකාරිත්වයට දායක වූ අතර, සේවා අංශයේ උප අංශයන් වූ දේශීය වෙළෙඳාම, ප්‍රවාහනය, භාණ්ඩ මෙහෙයවීම වරාය සහ සිවිල් ගුවන් සේවා සහ හෝටල් හා ආපනශාලා යන උප අංශයන් යථා තත්ත්වයට පත්වීම වසරේ දෙවන භාගයේ සේවා අංශයේ කටයුතුවල වර්ධනය සඳහා හේතු විය. රට තුළ පැවැති අභ්‍යන්තර ගැටුම්කාරී තත්ත්වය නිමා වීම සහ උතුරු හා නැගෙනහිර දෙපළාතෙහි ආර්ථික කටයුතු පුළුල් වීම තුළින් සේවා අංශයේ දේශීය වෙළෙඳාම සහ ප්‍රවාහන යන උප අංශවලට ප්‍රතිලාභ ලැබුණි. වසරේ අවසාන කාර්තුවේ දී ගෝලීය අවපාත තත්ත්වය ලිහිල් වීම හේතු කොට ගෙන සේවා අංශයේ උප අංශයක් වූ භාණ්ඩ මෙහෙයවීම-

**2.1 රූප සටහන** **වාර්ෂික වර්ධන අනුපාතික**




වරාය සහ සිවිල් ගුවන් සේවා අංශවල සැලකිය යුතු වර්ධනයක් ඇති විය. රටට සාමය උදා වීමත් සමඟ දේශීය හා විදේශීය සංචාරක කටයුතු පුළුල් වීම නිසා හෝටල් සහ ආපනශාලා උප අංශයෙහි ශීඝ්‍ර වර්ධනයක් ඇති විය. ආහාර පාන උප අංශයේ ඇති වූ ශක්තිමත් වර්ධනය හා නිෂ්පාදන කර්මාන්ත උප අංශය විසින් විදේශීය ඉල්ලුම වර්ධනය කිරීම සඳහා ඇති කරන ලද ධනාත්මක ප්‍රතිචාර සමඟ කර්මාන්ත ශාලා උප අංශයේ වර්ධනය ශක්තිමත් විය. වසරේ දෙවන භාගයේ දී අපනයන ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් මැණික් පතල් කර්මාන්තය කඩිනමින් යථා තත්ත්වයට පත්විය. 2009 වසරේ දී රට තුළ මහා පරිමාණ ව්‍යාපෘති කිහිපයක ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සහ නැගෙනහිර පළාතේ ඉදිරිකිරීම් කටයුතු කඩිනම් කිරීම සිදු වුව ද නිවාස ඉදිකිරීම් අංශයේ සිදු වූ මන්දගාමීත්වය ඉදිකිරීම් උප අංශයේ වර්ධනය පහත වැටීමට හේතු විය.

**උද්ධමනය පහත වැටීමත් සමඟ 2009 වසරේ දී දේශීය ඉල්ලුම සියයට 3.4 කින් වර්ධනය විය.** මෙම වර්ධනයට මූලික වශයෙන් දායක වූයේ පරිභෝජන ඉල්ලුම මධ්‍යස්ථ වේගයකින් ඉහළ යාම සහ ආයෝජන ඉල්ලුම ආන්තික වශයෙන් වර්ධනය වීමයි. අපනයන පහත වැටීම ආනයන පහත වැටීමට වඩා තීව්‍ර වූ හෙයින්, සමස්ත විදේශ ඉල්ලුමෙහි මූර්ත අගය පහත වැටිණි. මේ අතර, අභ්‍යන්තර ගැටුම් අවසාන වීමෙන් පසු කොටස් වෙළෙඳපොළ, සංචාරක කටයුතු සහ දේශීය වෙළෙඳාම් වැනි අංශවල සිත් ගන්නා සුළු වර්ධනයක් ඇති වීමත් සමඟ දේශීය ආර්ථික කටයුතුවල ක්‍රමානුකූල පිබිදීමක් ඇති විය.

**දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) එනම් විදේශීය ශුද්ධ සාධක ආදායම (වි.ශු.සා.ආ.) ට ගලපන ලද දළ දේශීය නිෂ්පාදිතය 2008 වසර තුළ දී ලැබූ සියයට 4.6 ක ප්‍රසාරණයට සාපේක්ෂව 2009 වසර තුළ දී සියයට 4.8 කින් මූර්ත වශයෙන් ප්‍රසාරණය විය.** ගෙවුම් ශේෂයේ ආදායම් ගිණුමෙහි ශේෂයට සමාන වූ විදේශීය ශුද්ධ සාධක ආදායම 2009 වසර තුළ සැලකිය යුතු අන්දමින් වර්ධනය විය. ජාත්‍යන්තර පොලී අනුපාත පහළ යාම විදේශීය ණය සඳහා ගෙවිය යුතු පොලිය අඩු වීමට හේතු වූ අතර රටෙහි විදේශ සංචිත සැලකිය යුතු අන්දමින් ඉහළ යාම, වැඩි ආයෝජන ආදායමක් ජනිත කිරීමට හේතු විය. මෙහි සමස්ත බලපෑම පිළිවෙළින් විදේශීය ශුද්ධ සාධක ආදායම වර්ධනයට හා ද.ජා.නි. වර්ධනයට හේතු විය.

**ජීවන තත්ත්වයෙහි සමස්ත වර්ධනයක් සිදු වීම පෙන්නුම් කරමින් 2008 වසරේ දී රුපියල් 218,167ක්ව පැවැති ඒක පුද්ගල ආදායම 2009 වසර තුළ සියයට 8 කින් වර්ධනය වී රුපියල් 235,945 අගයට ළඟා විය.** මෙය 2009 වසරේ දී සියයට 3.4 ක් වූ උද්ධමනයේ බලපෑම ඉක්මවා යාමකි. එ.ජ.ඩොලර් වටිනාකම අනුව ගත් කල 2008 වසරේ එ.ජ.ඩොලර් 2,014 ක්ව පැවැති ඒක පුද්ගල ආදායම 2009 වසර තුළ එ.ජ.ඩොලර් 2,053 මට්ටමට ළඟා විය.

**2009 වසරේ දළ දේශීය නිෂ්පාදිතය පවත්නා වෙළඳපොළ මිල අනුව රුපියල් බිලියන 4,825 ක් (එ.ජ.ඩොලර් බිලියන 42 ක්) ලෙස ඇස්මේන්තු කර ඇති අතර එය සියයට 9.4ක වර්ධනයකි.** දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකය මගින් මනින ලද සාමාන්‍ය මිල මට්ටමෙහි සියයට 5.7 ක වර්ධනය සහ සියයට 3.5 ක් වූ මූර්ත ආර්ථික වර්ධනය මගින් ද දළ දේශීය නිෂ්පාදිතයේ මෙම නාමික වර්ධනය පිළිබිඹු විය.

**ආනයන භාණ්ඩ සඳහා වූ පාරිභෝජන ඉල්ලුම පහත වැටීමේ බලපෑම පෙන්නුම් කරමින් 2008 වසරේ දේශීය ඉතුරුම් සියයට 2.8 දක්වා පහත වැටුණු අතර, 2009 වර්ෂය තුළ දී එය සියයට 42.2 කින් ප්‍රසාරණය වෙමින් රුපියල් බිලියන 870 දක්වා ළඟා විය.** පාරිභෝගික, අතරමැදි හා ආයෝජන භාණ්ඩ ඇතුළු සමස්ත ආනයන වියදම 2008 වසරේ පැවැති සියයට 22.0 ක වර්ධනයට සාපේක්ෂව 2009 වසර තුළ දී සියයට 23.1 කින් අඩු වීමක් පෙන්නුම් කළේය. ඒ අනුව, දේශීය ඉතුරුම් අනුපාතය පෙර වසරේ පැවැති සියයට 13.9 ට සාපේක්ෂව 2009 වසරේ දී සියයට 18.0 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**2008 වසරේ සියයට 17.8 ක්ව පැවැති ජාතික ඉතුරුම් අනුපාතය 2009 වසර තුළ දී සියයට 23.9 දක්වා වර්ධනය විය.** මෙම තත්ත්වයට විදේශීය ශුද්ධ සාධක ආදායමෙහි හිතකර ක්‍රියාකාරිත්වය සහ 2009 වසර තුළ දී ශුද්ධ විදේශීය පෞද්ගලික සංක්‍රාම එ.ජ.ඩොලර් බිලියන 3 ක මට්ටමක් දක්වා සියයට 21.2 කින් වර්ධනය වීම හේතු විය. එම සංක්‍රාම ප්‍රධාන වශයෙන් මැදපෙරදිග රටවල සිටින සේවක ප්‍රේෂණ වලින් සමන්විත විය.

## 2.2 ආංශික නිමැවුම, ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටළු

### කෘෂිකාර්මික අංශය

**කෘෂිකාර්මික අංශය, 2008 වසරේ වාර්තා කළ සියයට 7.5 ක ඉහළ වර්ධනයට සාපේක්ෂව 2009 වසර තුළ දී සියයට 3.2 ක් වූ මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය.** පෙර වර්ෂය හා සැසඳීමේ දී තේ සහ වී යන උප අංශයන්හි නිෂ්පාදනය පහත වැටීම කෘෂිකාර්මික අංශයේ සමස්ත වර්ධනය අඩු වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. අපනයන කෘෂිකාර්මික අංශයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් රබර් නිෂ්පාදනයේ වැඩි වීම හා සුළු අපනයන බෝග අංශයේ වර්ධනය ද ආයක විය. විශේෂයෙන්ම, මුදාගත් ප්‍රදේශවල ධීවර කටයුතු ඉහළ යෑම ද ඇතුළුව මාළු නිෂ්පාදනය වැඩි වීම කෘෂිකාර්මික අංශයේ සතුටුදායක වර්ධනය කෙරෙහි ආයක විය.

### අපනයන කෘෂිකර්මය

**2008 වසර හා සැසඳීමේදී 2009 වසර තුළ තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 290 ක් දක්වා සියයට 9.1 කින් අඩු විය.** විශේෂයෙන්ම, 2009 වසරේ පළමු කාර්තුවෙහි තේ වගා කරන සියළුම දිස්ත්‍රික්ක වල පැවති වියලි කාලගුණික පරිසරය මෙම අඩුවීම සඳහා බෙහෙවින් හේතු විය. ලෝක මූල්‍ය අර්බුදය හේතුවෙන් 2008 වසරේ අවසාන කාර්තුවේදී පහළ ගිය තේ මිලවල බලපෑම 2009 මුල් මාස දෙක තුළ ද තේ කර්මාන්තය කෙරෙහි බලපෑවේය. අර්බුද කාලය තුළ තේ පඳුරු කප්පාදු කිරීම වැනි තේ වගාකරුවන් විසින් ගන්නා ලද ඇතැම් ක්‍රියා මාර්ගයන් ද නිෂ්පාදනය අඩුවීම කෙරෙහි බලපෑවේය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2009 පළමු කාර්තුව තුළ තේ නිෂ්පාදනය සියයට 42 කින් සැළකිය යුතු ලෙස පහළ ගියේය. නමුත් 2008 වසරේ අවසාන කාර්තුව හා සැසඳීමේදී 2009 එම කාල පරිච්ඡේදය තුළ තේ නිෂ්පාදනය සියයට 17 ක වර්ධනයක් පෙන්වීය. දෙවන කාර්තුවේ සිට පැවති යහපත් කාලගුණික තත්ත්වය, විශේෂයෙන්ම මෙම කාර්තුවේ සිට තේ සඳහා ලෝක වෙළෙඳපොළෙහි ඉල්ලුම ඉහළයාම සමග වැඩිවූ තේ මිල ගණන් සහ රජය හා අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් තේ කර්මාන්තය ඉහළ නැංවීම සඳහා ගන්නා ලද ඇතැම් ක්‍රියා මාර්ගයන් මේ සඳහා හේතු විය. මේ අතර වසර අවසානයේදී වතු කම්කරුවන් විසින් සිදුකරන ලද අකුරට වැඩ කිරීම වැනි වැඩ වැරීම් කටයුතු ද තේ කර්මාන්තයේ වර්ධනයට යම් බාධාවක් විය. 2009 වසර තුළ දී ශ්‍රී ලංකාවේ මෙන්ම වෙනත් තේ නිපදවන බොහොමයක් රටවලද නිෂ්පාදනය පහළ ගිය අතර ඒ හේතුවෙන් 2008 වසර හා සැසඳීමේදී 2009 වසර තුළ ලෝක තේ නිෂ්පාදනය සියයට 2.2 කින් අඩු විය.

**2.2 සංඛ්‍යා සටහන — කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක (1997-2000=100)**

| අයිතමය | 2008(අ) | 2009(ආ) | වර්ධන වේගය(%) 2009/08 |
|---|---|---|---|
| කෘෂිකාර්මික සහ මත්ස්‍ය | 124.0 | 121.9 | -1.7 |
| 1. කෘෂිකර්මය | 125.1 | 121.5 | -2.9 |
| 1.1 කෘෂිකාර්මික බෝග | 123.2 | 118.7 | -3.7 |
| තේ | 111.0 | 100.9 | -9.1 |
| රබර් | 134.0 | 141.9 | 5.9 |
| පොල් | 104.8 | 99.5 | -5.1 |
| වී | 145.4 | 137.0 | -5.8 |
| අනෙකුත් බෝග | 123.7 | 132.6 | 7.2 |
| 1.2 පශු සම්පත් | 142.4 | 146.6 | 2.9 |
| 2. මත්ස්‍ය | 116.9 | 124.4 | 6.5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**2009 වසරේ දී කොළඹ තේ වෙන්දේසියේ, සියවසකට වැඩි ඉතිහාසයක් සහිත තේ කර්මාන්තයේ තේ සඳහා වූ ඉහළම මිල ගණන් වාර්තා විය.** සියලු තේ වල වාර්ෂික සාමාන්‍ය මිල මට්ටම 2008 වසරේ පැවති කිලෝ ග්‍රෑමයකට රුපියල් 302 සිට කිලෝ ග්‍රෑමයකට රුපියල් 360 දක්වා ඉහළ ගිය අතර සාමාන්‍ය අපනයන මිල ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 470 දක්වා සියයට 9.3 කින් ඉහළ ගියේය. දේශීයව හා ලෝක වෙළෙඳපොළෙහි කලු තේ (සම්ප්‍රදායික තේ සහ සී.ටී.සී. තේ) නිෂ්පාදනයේ පැවති සැළකිය යුතු හිඟය තේවල මිල ගණන් කැපී පෙනෙන ආකාරයෙන් ඉහළයාම කෙරෙහි විශාල වශයෙන් බලපෑවේය.

**2009 වසර තුළ රබර් නිෂ්පාදනය සියයට 5.9 ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්වීය.** 2009 වසර තුළ රබර් එළදාව පෙර වසරට සාපේක්ෂව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 1,437 දක්වා සියයට 4 කින් වර්ධනය විය. ලෝක වෙළෙඳපොළේ රබර් සඳහා වූ ඉල්ලුම අඩුවීම හේතුවෙන් වසරේ මුල් භාගය තුළ රබර් මිල අඩුවීම එහි නිෂ්පාදනය කෙරෙහි ද බලපෑවේය. රබර් මිල අඩුවීම පොහොර භාවිතය අඩුවීමට ද හේතු විය. මේ අතර, බොර තෙල් මිල අඩු වීම හේතුවෙන් කෘත්‍රිම රබර් මිල ගණන් අඩු වූ අතර, රබර් ආශ්‍රිත කර්මාන්තයන් සඳහා කෘත්‍රිම රබර් භාවිතයට මෙය අනුබලයක් විය. කෙසේ වෙතත්, 2008 වසරේ දෙවන භාගය හා සසඳන විට 2009 වසරේ එම කාලය තුළ ශ්‍රී ලංකාවේ රබර් නිෂ්පාදනය සියයට 8.7 ක ඉහළ වර්ධනයක් පෙන්වීය. විශේෂයෙන්ම වසර අවසානය වනවිට ලෝක ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත්, බොර තෙල් මිලෙහි සිදු

වූ ක්‍රමික ඉහළ යාමත් සමඟ ස්වභාවික රබර් මිල ගණන්ද ක්‍රමයෙන් ඉහළ ගියේය. වසර අවසානයේදී ස්වභාවික රබර් මිල ඉහළයාම කෙරෙහි ප්‍රධාන රබර් නිෂ්පාදනය කරන රටවල් වූ තායිලන්තය, මැලේසියාව, සහ ඉන්දුනීසියාව වැනි රටවල වූ අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් වූ සැපයුම අඩාලවීම ද හේතුවිය.

**වසර තුළ සියලුම රබර් ප්‍රභේදයන්ගේ මිලගණන් තියුණු ලෙස උච්ඡාවචනයට භාජනය වූ අතර ක්‍රේප් රබර් ප්‍රභේදයන්වල විශාල ප්‍රමාණයේ මිල විචලනයක් දක්නට ලැබුණි.** 2009 පළමු කාර්තුව සමඟ සසඳනවිට හතරවන කාර්තුව තුළදී, ආර්.එස්.එස්. 1 (දුම් ගැසූ ෂීට් රබර්) රබර් ප්‍රභේදයේ සාමාන්‍ය මිල, කිලෝ ග්‍රෑමයක් රුපියල් 286 දක්වා සියයට 97 කින් ද හා ආර්.එස්.එස්. 2 හි කිලෝ ග්‍රෑමයක් රුපියල් 287 දක්වා සියයට 95 කින්ද, ඉහළ ගියේය. වසරේ පළමු කාර්තුව හා සැසඳීමේදී හතරවන කාර්තුව තුළදී ක්‍රේප් රබර් ප්‍රභේදයන් වූ ලේටෙක්ස් ක්‍රේප් සහ ක්‍රේප් 1 හි සාමාන්‍ය මිල පිළිවෙලින් කිලෝ ග්‍රෑමයක් රුපියල් 318 දක්වා සියයට 127 කින්ද කිලෝ ග්‍රෑමයක් රුපියල් 315 දක්වා සියයට 128 කින්ද ඉහළ ගියේය.

**2009 වසරේ පළමු භාගයේ දී කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ පොල් නිෂ්පාදනය දෙවන භාගයේ දී අඩුවීමත් සමඟ 2009 වසරේ පොල් නිෂ්පාදනය සියයට 5 කින් පහත වැටුණි.** යහපත් කාලගුණික තත්ත්වයේ පසුකාලීන බලපෑම හේතුවෙන් 2008 වසරේ මුල් භාගයට සාපේක්ෂව 2009 වසරේ මුල් භාගය තුළ පොල් නිෂ්පාදනය සියයට 18.3 කින් වර්ධනය විය. 2008 වසරේ දෙවන භාගයේ ප්‍රධාන පොල් වගා ප්‍රදේශවල ඇති වූ අඩු වර්ෂාපතනය හා ඉහළ උෂ්ණත්වය ආදී අයහපත් කාලගුණික තත්ත්වයේ පසුකාලීන බලපෑම මෙන්ම එම කාලපරිච්ඡේදය තුළ භාවිත කළ පොහොර ප්‍රමාණය අඩුවීම ද 2009 වර්ෂයේ දෙවන භාගය තුළ පොල් නිෂ්පාදනය අඩුවීම කෙරෙහි බලපෑවේය. මේ අතර, 2009 වසරේ අප්‍රේල් සිට පාම් තෙල් ආනයන මත පැනවූ බදු ඉහළ නැංවීම හේතුවෙන් වසරේ පොල්තෙල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 75,490 ක් දක්වා සියයට 28 කින් (පොල් ගෙඩි මිලියන 598) වර්ධනය විය. මෙම තත්ත්වය පොල්තෙල් කර්මාන්තය නැවත යථා තත්ත්වයට පත්වීමට හේතු වූ අතර පොල්තෙල් නිෂ්පාදකයෝ විශාල ප්‍රමාණයක් සිය නිෂ්පාදන කටයුතු යළි ආරම්භ කළහ. මෙම තත්ත්වය මත පොල් වගාකරුවන්, කොප්පරා හා පොල්තෙල් නිෂ්පාදනය කරා යොමු වූ අතර වසර අවසානය වන විට පොල් ගෙඩියක නිෂ්පාදන මිල ඉහළ යාමත් සමඟ පොල් වගාකරුවන්ගේ ආදායම ද ඉහළ ගියේය. දිවයිනේ

**2.3 සංඛ්‍යා සටහන** **ප්‍රධාන කෘෂි බෝගවල උපනතීන්**

| අයිතමය | ඒකකය | 2008(අ) | 2009(ආ) |
|---|---|---|---|
| 1. තේ | | | |
| 1.1 නිෂ්පාදනය (ඇ) | කි.ග්‍රෑ. මිලියන | 318.7 | 289.8 |
| 1.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 222 | 222 |
| 1.3 දළු කැඩීම සිදුකරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 193 | 193 |
| 1.4 නිෂ්පාදන පිරිවැය (ඈ) | රුපියල්/කි.ග්‍රෑ. | 262.60 | 269.00 |
| 1.5 සාමාන්‍ය මිල | | | |
| - කොළඹ වෙන්දේසිය | රුපියල්/කි.ග්‍රෑ. | 301.63 | 360.85 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 430.40 | 470.11 |
| 1.6 නැවත වගා කිරීම | හෙක්ටයාර | 1,385 | 1,081 |
| 1.7 අළුතින් වගා කිරීම | හෙක්ටයාර | 11 | 12 |
| 1.8 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 1.6 | 1.7 |
| 2. රබර් | | | |
| 2.1 නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලියන | 129.2 | 136.9 |
| 2.2 මුළු වගා බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 122 | 124 |
| 2.3 කිරි කපන ලද බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 94 | 95 |
| 2.4 නිෂ්පාදන පිරිවැය | රුපියල්/කි.ග්‍රෑ. | 114.00 | 115.50 |
| 2.5 සාමාන්‍ය මිල | | | |
| - කොළඹ වෙන්දේසිය (ආර්.එස්.එස්.නො.1) | රුපියල්/කි.ග්‍රෑ. | 269.51 | 211.65 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 278.20 | 202.23 |
| 2.6 නැවත වගා කිරීම (උ) | හෙක්ටයාර දහස් | 6,105 | 1,002 |
| 2.7 අළුතින් වගා කිරීම (උ) | හෙක්ටයාර දහස් | 2,436 | 1,156 |
| 2.8 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 0.8 | 0.5 |
| 3. පොල් | | | |
| 3.1 නිෂ්පාදනය | ගෙඩි මිලියන | 2,909 | 2,762 |
| 3.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 363 | 363 |
| 3.3 නිෂ්පාදන පිරිවැය | ගෙඩියකට රුපියල් | 12.47 | 9.10 |
| 3.4 සාමාන්‍ය මිල | | | |
| - නිෂ්පාදන මිල | ගෙඩියක් රුපියල් | 22.71 | 18.36 |
| - අපනයන (නැ.වි.ස.) (ඌ) | ගෙඩියක් රුපියල් | 24.77 | 18.23 |
| 3.5 නැවත වගා කිරීම/ යටි වගාව (එ) | හෙක්ටයාර | 2,468 | 3,020 |
| 3.6 අළුතින් වගා කිරීම (එ) | හෙක්ටයාර | 3,682 | 3,945 |
| 3.7 එකතු කළ අගය ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් (ඉ) | | 1.8 | 1.3 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දළු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ.
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි.
(ඊ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2003 දී පවත්වන ලද කෘෂිකර්ම සංගණනය මත පදනම්ව රබර් වගාව යටතේ ඇති බිම් ප්‍රමාණය සංශෝධනය කර ඇත.
(උ) රබර්සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(ඌ) ප්‍රධාන පොල් නිෂ්පාදන තුන සඳහා පමණි.
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් ආවරණය වේ.

මූලයන් : ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
වැවිලි සමාගම්
ශ්‍රී ලංකා රේගුව
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2.4 සංඛ්‍යා සටහන**

**වී වගා අංශය පිළිබඳ සංඛ්‍යා**

| අයිතමය | ඒකකය | 2008 (අ) | | | 2009 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| වපුරන ලද බිම් ප්‍රමාණය දළ වශයෙන් | හෙක්ටයාර දහස් | 582 | 471 | 1,053 | 632 | 345 | 978 |
| අස්වැන්න නෙලා ගත් දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 568 | 465 | 1,033 | 605 | 338 | 943 |
| අස්වැන්න කපා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 508 | 417 | 925 | 539 | 303 | 842 |
| නිෂ්පාදනය | මෙ.ටො.දහස් | 2,125 | 1,750 | 3,875 | 2,384 | 1,268 | 3,652 |
| | බුසල් දහස් | 101,850 | 83,871 | 185,721 | 114,254 | 60,755 | 175,009 |
| ඵලදාව (ඇ) | හෙක්ටයාරයට කි.ග්‍රෑ. | 4,181 | 4,195 | 4,187 | 4,421 | 4,187 | 4,336 |
| දෙන ලද ණය ප්‍රමාණය | රුපියල් මිලියන | 788 | 816 | 1,605 | 1,161 | 685 | 1,847 |
| සහල් ආනයනය | මෙ.ටො.දහස් | - | - | 84 | - | - | 52 |
| සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය | මෙ.ටො.දහස් | - | - | 124 | - | - | 77 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අස්වනු කැපීමේ සමීක්ෂණයන්ගෙන් රැස්කළ දත්ත පදනම් කොට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද සංඛ්‍යා තොරතුරු උපයෝගී කරගෙන මහ සහ යල කන්න සඳහා වූ හෙක්ටයාරයක ඵලදාව ගණනය කර ඇත. මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයක වාර්ෂික සාමාන්‍ය ඵලදාව ගණනය කෙරේ.

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පොල්තෙල් කර්මාන්තය තවදුරටත් නංවාලීම සඳහා කොප්පරාවල තත්ත්වය වැඩිදියුණු කිරීම, පවතින යන්ත්‍රෝපකරණවල නිෂ්පාදන ධාරිතාව වැඩිදියුණුකිරීම, කුරුටු තෙල් නිස්සාරණය සඳහා තත්ත්වයෙන් උසස් පොල් කුරුටු භාවිතය සහ පොල් කුඩු භාවිතයෙන් සිදුකරන පොල්තෙල් නිෂ්පාදනය වැඩිකිරීම ආදී ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍යවේ.


**කුරුඳු, කරාබුනැටි හා ගම්මිරිස් ආදී අනෙකුත් අපනයන බෝග නිෂ්පාදන, 2009 වසර තුළ මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** වැඩි වූ අපනයන ඉල්ලුමට සමගාමීව ඉහළ ගිය අපනයන මිල ගණන් හේතුවෙන් කුරුඳු හා කොකෝවා නිෂ්පාදනය පිළිවෙළින් සියයට 5 කින් හා සියයට 45 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, වසර තුළ ගම්මිරිස් නිෂ්පාදනය සියයට 5 කින් ද, කරඳමුංගු සියයට 10 කින් ද, කෝපි සියයට 21 කින් සහ කරාබුනැටි සියයට 63 කින් ද අඩු විය. ගම්මිරිස් නිෂ්පාදනය අඩුවීම කෙරෙහි, ජූලි සිට අගෝස්තු දක්වා ප්‍රධාන අස්වනු නෙලන කාලයේදී මහනුවර හා මාතලේ දිස්ත්‍රික්කවලට නොකඩවා ඉහළ වර්ෂාපතනයක් ලැබීම හේතුවෙන් අස්වැන්න අඩුවීම සහ ගම්මිරිස් අපනයන මිල ගණන් සැලකිය යුතු ලෙස පහළ මට්ටමක පැවතීම ද හේතු විය. සාමාන්‍යයෙන් වසර හතරකට වරක් ලැබෙන කරාබුනැටිවල ඉහළ ඵලදාව වසර 2008 දී වාර්තා විය. එබැවින්, ඉහළම ඵලදාව ලැබූ වසරට පසු වසරේ දී කරාබුනැටි ඵලදාව අඩුවීම මෙයින් පෙන්නුම් කෙරේ.

## දේශීය කෘෂිකර්මය

**2009 වසරේ මුළු වී නිෂ්පාදනය, මෙතෙක් ඉහළ ම වී නිෂ්පාදනය ලෙස 2008 වසරේ පැවති මෙට්‍රික් ටොන් මිලියන 3.87 ට සාපේක්ෂව මෙට්‍රික් ටොන් මිලියන 3.65 ක් දක්වා සියයට 5.8 කින් පහත වැටුණි.** 2009 වසරෙහි මෙම සමස්ත පහත වැටීමට, 2008 යල කන්නයේ ලබාගත් වාර්තා ගත නිෂ්පාදනයට සාපේක්ෂව 2009 යල කන්නයේ නිෂ්පාදනය සියයට 27.6 ක පහත වැටීම ප්‍රධාන වශයෙන් බල පැවේය. මේ සඳහා ප්‍රධාන ලෙසම හේතු වූයේ මෝසම් වර්ෂාව ලැබීම පමාවීම හා එහි ප්‍රතිඵලයක් ලෙස වගාව සඳහා ජල සැපයුම ප්‍රමාද වීම හේතුවෙන් වගාවට ප්‍රමාණවත් පරිදි ජලය නොලැබීයාමය. කෙසේ වෙතත්, වගා කළ බිම් ප්‍රමාණය ඉහළයාම සහ වගා කන්නය පුරා

**2.2 රූප සටහන**

**සහල් : සැපයුම සහ ඉල්ලුම**



පැවැති යහපත් කාලගුණික තත්ත්වය මත ඵලදායීතාවය ඉහළ යාම නිසා 2008/09 මහ කන්නයෙහි වී නිෂ්පාදනය, පෙර මහ කන්නයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් මිලියන 2.4 ක් දක්වා සියයට 12.2 කින් ඉහළ ගියේය.

**වසර තුළදී අනෙකුත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනයේ මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය.** 2009 වසරේදී නිෂ්පාදන මිලගණන් හා දේශීය පරිභෝජනය ඉහළ යාම හේතුවෙන් බඩ ඉරිඟු නිෂ්පාදනය 2008 වසරට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 129,800 දක්වා සියයට 15 කින් පමණ වර්ධනය විය. වසර තුළදී බඩ ඉරිඟු ආනයනය සඳහා පැවති ආනයන බද්ද ඉහළ දැමූ අතර, පසුව 2009 මාර්තු මස සිට දේශීය ගොවීන් ආරක්ෂා කරනු පිණිස බඩ ඉරිඟු ආනයනයට සීමාවන් පනවන ලදී. ලොකු ළූණු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 81,700 දක්වා සියයට 42 කින් වර්ධනය වීමට පැවති යහපත් කාලගුණික තත්ත්වයත් සමඟ ඵලදායිතාවය ඉහළ යෑම හා වාණිජ බෝග කෙරෙහි ගොවීන්ගේ යොමුවීමත් බලපෑවේය. කෙසේ වෙතත්, 2009 දී අර්තාපල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 61,700 දක්වා සියයට 18 කින් අඩු වූ අතර, අමු මිරිස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 46,400 දක්වා සියයට 9 කින් අඩු විය. අර්තාපල් නිෂ්පාදනය අඩුවීම කෙරෙහි අයහපත් කාලගුණය දැඩි බලපෑමක් ඇති කළ අතර, අමු මිරිස් නිෂ්පාදනය පහළ යාම කෙරෙහි යල කන්නයෙහි වර්ෂාව අඩුවීමේ හේතුවෙන් කල් පසු වී වගා කිරීම් ඇරඹීම ප්‍රධාන වශයෙන් හේතු විය.

**2009 වසරේ සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 31,608 ක් දක්වා සියයට 20 කින් පහත වැටුණි.** මෙම නිෂ්පාදනය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑවේ වැසි දිය මත උක් වගා කරනු ලබන පැළවත්ත ප්‍රදේශය පුරා පැවති නියඟයේ බලපෑමයි. උක් වගාබිම් අඩුවීමට හේතුවූයේ ගොවීන් විසින් කෙසෙල්, ධාන්‍ය, සෝයා බෝංචි සහ වී වැනි කෙටිකාලීනව ඵලදරණ බෝග වගාවන්ට නැඹුරුවීමයි. සිනී නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා උක් වගාකරුවන්ට සාධාරණ මිලක් ලබාදෙමින් ඔවුන් වගාවට ආකර්ෂණය කර ගැනීම උපකාරී වනු ඇත. මේ අතරම, වසා දැමූ හිඟුරාණ සහ කන්තලේ සිනී කර්මාන්තශාලා යළි ආරම්භ කිරීම සඳහා දැනටමත් ක්‍රියා කර ඇති අතර, සැලසුම් කළ අනෙකුත් සීනි කර්මාන්තශාලාද ආරම්භ කරමින් ජාතික සීනි නිෂ්පාදනය වර්ධනය කළ යුතුය. මේ අතර, සීනි පර්යේෂණ ආයතනය විසින් වසර තුළ දී දේශීය වශයෙන් දියුණු කළ උසස් තත්ත්වයේ උක් ප්‍රභේද හතරක් වාණිජ වගා කටයුතු සඳහා හඳුන්වා දෙන ලදී.

**2009 වසරේ දී මුළු දියර කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 233 දක්වා සියයට 12.1 ක වර්ධනයක් පෙන්නුම් කළේය.** මෙම වර්ධනයට කිරි සඳහා ඉහළ මිලක් ගෙවීම සහ කිරි ගව පාලනය ව්‍යාප්ත කිරීමට ක්‍රියාත්මක කරන ලද වෙනත් ක්‍රියාමාර්ග උපකාරී විය. 2009 වසරෙහි මුළු කිරි නිෂ්පාදනය, ලීටර් මිලියන 184 ක් වූ එළකිරි නිෂ්පාදනය (සියයට 7 ක වර්ධනයක්) සහ ලීටර් මිලියන 49.3 ක් වූ මී ගව කිරි නිෂ්පාදනය (සියයට 38 ක වර්ධනයක්) ඇතුළත්ව ඇත. යෝගට් නිෂ්පාදනය සියයට 73 කින් ද, මුදවාපු කිරි නිෂ්පාදනය සියයට 28 කින් ද වර්ධනය වෙමින් වසර තුළ දී කිරි ආහාර නිෂ්පාදන වල සුවිශේෂී වර්ධනයක් පෙන්නුම් කළේය. මිල්කෝ සමාගම විසින් අඹේවෙල, කොළඹ, දිගන සහ පොළොන්නරුවේ පිහිටා ඇති ඔවුන්ගේ කර්මාන්තශාලාවල ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළ අතර රට පුරා ඔවුන්ගේ කිරි එකතු කිරීමෙහි ජාලය පුළුල් කිරීමටද සැලසුම් කරන ලදී.

**2.5 සංඛ්‍යා සටහන** — **පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යා**

| | උප අංශය | 2008(අ) | 2009(ආ) |
|---|---|---|---|
| 1. | ජාතික ගවයන් සංඛ්‍යාව (මිලියන) | 1.5 | 1.4 |
| | එළ ගවයන් | 1.2 | 1.1 |
| | මී ගවයන් | 0.3 | 0.3 |
| 2. | ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | 208.1 | 233.4 |
| | එළ කිරි | 172.4 | 184.1 |
| | මී කිරි | 35.7 | 49.3 |
| 3. | කිරි ආහාර නිෂ්පාදනය (ලීටර් මිලියන) | 13.5 | 23.3 |
| 4. | නිෂ්පාදන මිල - එළකිරි (රු./ලීටර්) | 29.53 | 29.53 |
| 5. | ජාතික බිත්තර නිෂ්පාදනය (මිලියන) | 1,039.8 | 1,142.2 |
| 6. | ජාතික කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්) | 101.5 | 99.28 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

**2009 වසර තුළ දී, කුකුළු මස් නිෂ්පාදනය සියයට 3 කින් අඩු වූ අතර, බිත්තර නිෂ්පාදනය සියයට 10 කින් ඉහළ ගියේය.** 2008 දී අභිජනන මව් සතුන් සැපයුමේ සිදු වූ අඩුවීම නිසා එක් දිනක් වයසැති කුකුළු පැටවුන් නිෂ්පාදනය 2009 වසර තුළදී පහත වැටීම, ඇතැම් කුකුළු ගොවිපලවල් තුළින් වාර්තා වූ සතුන්ගේ රෝගාබාධ ආදී ගැටළු සහ වසර තුළදී සත්ත්ව ආහාර මිල ගණන්වල ඉහළයාම කුකුළු මස් නිෂ්පාදනය පහත වැටීමට හේතුවිය. තවද, එක දිනක් වයසැති කුකුළු පැටවුන් සැපයුම අඩුවීම සහ වසර අවසානය වනවිට බිත්තර සඳහා පැවති ඉහළ ඉල්ලුමත් සමඟ සාපේක්ෂ වශයෙන් වැඩි වූ මිල ගණන් හේතුවෙන් දැනට බිත්තර සඳහා යොදාගන්නා කිකිළියන්ගේ නිෂ්පාදිත කාල සීමාව දීර්ඝ කිරීමට කුකුළු ගොවිපල හිමියන්ට සිදු විය. 2009 වසරේ

බිත්තර නිෂ්පාදනයේ වර්ධනයට උතුරු හා නැගෙනහිර පළාත්වල නිෂ්පාදනය ඉහළ යාමද කිසියම් දුරකට දායක විය.

### ධීවර

**වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදිතය 2009 වසරේ දී මෙට්‍රික් ටොන් 339,730 ක් දක්වා සියයට 6.5 කින් ඉහළ ගියේය.** මුහුදු මත්ස්‍ය නිෂ්පාදිතය සියයට 6.8 කින් වර්ධනය වූ අතර අභ්‍යන්තර ජලජීවී හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදිතය සියයට 4.7 කින් වර්ධනය විය. 2009 වසරේ මුහුදු මත්ස්‍ය නිෂ්පාදිතයේ වර්ධනයට මූලික වශයෙන්ම බලපෑවේ මුහුදුබඩ මත්ස්‍ය නිෂ්පාදිතය සියයට 9.1 කින් වර්ධනය වීමයි. වසර තුළ දී උතුරු හා නැගෙනහිර පළාත්වල මත්ස්‍ය නිෂ්පාදනයේ නිරත වීමට පැවති බාධාවන් ඉවත් වීම මෙන්ම නැගෙනහිර පළාතේ ධීවරයන් යළි පදිංචිකිරීමේ ව්‍යාපෘතීන් සාර්ථකව ක්‍රියාත්මක වීම ද මේ සඳහා බලපෑවේය. කෙසේ වෙතත් ගැඹුරු මුහුදු ධීවර නිෂ්පාදිතය වර්ධනය වූයේ සියයට 3.2 තරම් සුළු ප්‍රමාණයකිනි. වසර තුළ දී මුහුදු මත්ස්‍ය මිල ගණන්වල අඩු විචලනයක් පැවතීමට උතුරු හා නැගෙනහිර පළාත්වලින් මත්ස්‍ය සැපයුම ඉහළයාම හේතු විය. මිරිදිය ජලාශවල මත්ස්‍ය නිෂ්පාදනය සියයට 5 කින් වැඩිවීම, ඉස්සන් ගොවිපොළ නිෂ්පාදනය සියයට 60 කින් ඉහළ යාම මෙන්ම අභ්‍යන්තර ජලාශවල වගාකළ මත්ස්‍ය නිෂ්පාදිතය සියයට 22 කින් අඩුවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලය ලෙස අභ්‍යන්තර ජලජීවී හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සුළු වශයෙන් වර්ධනය විය. අභ්‍යන්තර ජලාශවල මත්ස්‍ය නිෂ්පාදිතයේ අයහපත් ක්‍රියාකාරිත්වය සඳහා ප්‍රධාන වශයෙන් බලපෑවේ වියළි කාලගුණ තත්ත්වයයි. කෙසේ වෙතත් පසුගිය වසරේ සුදු පුල්ලි රෝගය හේතුවෙන් පසුබෑමකට ලක් වූ ඉස්සන් ගොවිපළ කර්මාන්තය 2009 වසරේ දී යථා තත්ත්වයට පත් විය.

**2.6 සංඛ්‍යා සටහන — මත්ස්‍ය නිෂ්පාදනය**

මෙට්‍රික් ටොන් දහස්

| උප අංශය | 2008(අ) | 2009(ආ) |
|---|---|---|
| මුහුදු මත්ස්‍ය (ඇ) | 275 | 293 |
| ජල ජීවී සහ මිරිදිය මසුන් | 44 | 47 |
| එකතුව | 319 | 340 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුහුදුබඩ සහ ගැඹුරු මුහුදු ධීවර අංශයන්

මූලය : ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය

### වන සම්පත්

**වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වන ආවරණය ඉහළ දැමීමට මහජන සහභාගිත්වය ඇතිව වන වගා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.** වන සම්පත් අංශයේ සංවර්ධනය වෙනුවෙන් මහජන සහභාගිත්ව වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම උදෙසා අදාළ පාර්ශවයන් සමග ගිවිසුම් වලට එළඹීමට වන සංරක්ෂක ජනරාල්වරයාට බලය පවරමින් 2009 වසරේ දී වන ආඥා පනත සංශෝධනය කරන ලදී. ඒ අනුව, අම්පාර, ත්‍රිකුණාමලය හා මඩකලපුව දිස්ත්‍රික්ක වල ගෙවතු වගා සංවර්ධනය, ඇළ ඉවුරු ආරක්ෂිත වගාවන්, වැව් ජලාධාර පුනරුත්ථාපනය හා විනාශ වූ කඩොලාන පද්ධති පුනරුත්ථාපනය කිරීම ආදිය ක්‍රියාත්මක විය. ඊට අමතරව, 2009 වසරේ දී හෙක්ටයාර 877 ක නැවත වන වගා කටයුතු ද සම්පූර්ණ කරන ලදී.

**තේ නිෂ්පාදනය, එහි ඵලදායිතාවය හා තේවල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හා තේ පර්යේෂණ ආයතනයේ කටයුතු දායක විය.** මෙම වර්ෂය තුළ කුඩා තේ වතු හිමියන් සඳහා තේ නැවත වගා කිරීමට ලබා දෙන සහනාධාරය (හෙක්ටයාරයකට රුපියල් 200,000) හා තේ පොහොර සහනාධාර වැඩපිළිවෙළ (කිලෝ ග්‍රෑම් 50 ක මිශ්‍ර පොහොර මල්ලක් රුපියල් 1000) සඳහා රජය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය හරහා පිළිවෙළින් රුපියල් මිලියන 179 ක් හා රුපියල් මිලියන 4,621 ක් වැය කළේය. මේ අනුව කුඩා තේ වතු හිමියන් වසර තුළ නැවත වගා කළ තේ බිම් ප්‍රමාණය හෙක්ටයාර 777 ක් විය. 2009 වසර තුළ ජාතික තේ නිෂ්පාදනය සඳහා කුඩා තේ වතු හිමියන් විසින් ලබාදුන් දායකත්වය මෙතෙක් එම අංශය විසින් ලබාදුන් ඉහළම දායකත්වය වූ සියයට 76 ක් විය. ගෝලීය මූල්‍ය අර්බුදයේ බලපෑමට ලක් වූ තේ නිෂ්පාදකයන් සඳහා සහනයක් වශයෙන් හඳුන්වා දුන් පොලී සහනාධාර වැඩපිළිවෙළ යටතේ රජය තේ කර්මාන්තශාලා 168 ක් සඳහා රුපියල් මිලියන 45 ක මුදලක් ලබා දුනි. මීට අමතරව, එකතු කළ අගය සහිත තේ අපනයන ඉහළ නැංවීම හා තේ පාරිභෝජනය කරන ප්‍රධාන රටවල් වල ශ්‍රී ලංකා තේ සන්නාමයන් ප්‍රචලිත කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පුළුල් තේ ප්‍රචාරණ කටයුතුවල නියැලෙන ලදී. එමෙන්ම, විදේශීය රටවල පාරිභෝගිකයින් තුළ ඕසෝන් හිතකාමී පිරිසිදු ශ්‍රී ලංකා තේ ප්‍රචලිත කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඕසෝන් හිතකාමී පිරිසිදු ශ්‍රී ලාංකීය තේ සඳහා ලාංඡනයක් ලියාපදිංචි කිරීම සඳහා ව්‍යාපෘතියක් හඳුන්වා දෙන ලදී. විදේශීය

රටවල තේ පාරිභෝගිකයන්ගේ අවධානයට ලක්ව ඇති නිෂ්පාදිත තේ තුළ පැවතිය හැකි උපරිම පලිබෝධ අවශේෂ ප්‍රමාණය පවත්වා ගැනීම සඳහා තේ පර්යේෂණ ආයතනය විසින් ආහාරවල සුරක්ෂිතතාව පිළිබඳ සැළකිලිමත් බව වැඩි කිරීමේ අරමුණින් ඒකාබද්ධ පලිබෝධ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් දියත් කරන ලදි.

**තේ ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා රජය විසින් විවිධ ක්‍රියා මාර්ග හඳුන්වා තිබියදීත් ශ්‍රී ලංකාවේ සාමාන්‍ය තේ නිෂ්පාදනයේ ඵලදායීතාවය, තරඟකාරී තේ නිෂ්පාදිත රටවල් හා සැසඳීමේදී අඩු මට්ටමක පවතී.** වර්තමානයේදී හෙක්ටයාරයකින් ලැබෙන සාමාන්‍ය ඵලදාව වන කිලෝ ග්‍රෑම් 1,550 ක ප්‍රමාණය ඉන්දියාවේ හෙක්ටයාරයකට ලැබෙන සාමාන්‍ය ඵලදාව වන කිලෝ ග්‍රෑම් 1,800 හා කෙන්යාවේ එම ප්‍රමාණය වන කිලෝ ග්‍රෑම් 2,400 ට වඩා සැලකිය යුතු ලෙස අඩු අගයක පවතී. තේ ඵලදායීතාවය ඉහළ නැංවීමේ ප්‍රයත්නයේදී තේ වතු වගා අංශය හා කුඩා තේ වතු හිමියන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන්නේ තේ පඳුරු වියපත්වීම පිළිබඳ ගැටළුවයි. උස්බිම් තේ ප්‍රදේශ වලින් සාමාන්‍යයෙන් සියයට 90 ක පමණ ප්‍රමාණයක තේ පඳුරු වසර 100 කට වඩා පැරණි වගා වන අතර පහත් බිම් ප්‍රදේශවල රිකිලි තේ පඳුරු බොහෝමයක් වසර 30 කට වඩා පැරණි වේ. එමනිසා, සෑම වසරකම නැවත තේ වගා කිරීමේ කටයුතු අවම වශයෙන් සියයට 3 ක වේගයකින්වත් පවත්වා ගැනීම අවශ්‍ය වේ. එසේම, වර්තමානයේ ජාතික මට්ටමේ තේ නැවත වගා කිරීමේ වේගය සියයට 0.7 ක තරම් වන ඉතා අඩු මට්ටමක පවතී. එබැවින්, වර්තමාන තේ නැවත වගා කිරීමේ වැඩ පිළිවෙළ තවදුරටත් පුළුල් කිරීම අවශ්‍ය වේ. එසේම, නැවත වගා කිරීමේ ක්‍රියාවලියේදී තේ පර්යේෂණ ආයතනය මගින් හඳුන්වා දුන් ඉහළ ඵලදාවක් ලබාදෙන ක්ලෝනයන් භාවිත කිරීමෙන් කාලගුණික විපර්යාසයන්ට, පලිබෝධවලට හා රෝගවලට වූ ප්‍රතිරෝධී වූ බව වර්ධනය කරගත හැකිය. එසේම, තේ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා පාංශු සංරක්ෂණ ව්‍යාපෘති ශක්තිමත් කිරීම හා කාබනික පොහොර භාවිතය වැඩි කිරීමද එකසේ වැදගත් වෙයි.

**රබර් පර්යේෂණ ආයතනය හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වසර ගණනාවක් මුළුල්ලේ කෘෂිවිද්‍යාත්මක ක්‍රම භාවිතය හා තාක්ෂණයේ වැඩිදියුණු කිරීම් තුළින් රබර් නිෂ්පාදනයේ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව දායක විය.** රබර් පර්යේෂණ ආයතනය, රබර් ඵලදායීතාවය අඩු වීමට බලපාන පමණ ඉක්මවා රබර් පැල වගා කිරීම වළක්වාලනු පිණිස රබර් පැල වගා කිරීමේ නිර්දේශිත භූමි ඝනත්වය හෙක්ටයාරයකට පැල 515 -520 ක් ලෙස සිය නිර්දේශය යළි සංශෝධනය කළේය. එසේම, රබර් කිරි කැපීම සඳහා ඇති ශ්‍රමික හිඟතාවය පිළිබඳ ගැටළුවට විධිමත් විසඳුමක් ලෙස දින 4 කට වරක් රබර් කිරි කැපීම සඳහා ක්‍රමවේදයක්ද රබර් පර්යේෂණ ආයතනය හඳුන්වා දුන්නේය. මෙම වසර තුළ රබර් පර්යේෂණ ආයතනය විසින් රබර් තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා ද සිය දායකත්වය ලබාදෙන ලදි. විශාල පරිමාණයේ වතු වගා ක්ෂේත්‍රයන් සඳහා රබර් ෂීට් වියලීම සඳහා එක් දින වියළුම් කුටීර ක්‍රමයක් වැඩි දියුණු කිරීම, ශල්‍යකර්ම කිරීමේදී පළඳින අත්මේස් නිෂ්පාදන කර්මාන්තය සඳහා ප්‍රෝටීන් ප්‍රමාණය අවම කරන ලද සාන්ද්‍ර කිරි නිපදවීම සහ ඉහළ ඵලදාවක් ලබාදෙන නව රබර් ක්ලෝනයන් පහක් හඳුන්වාදීම ඒ අතරට ඇතුළත් විය.

**වසර 2009 තුළ රබර් ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා ක්‍රියාමාර්ගයන් කිහිපයක් දියත් කරන ලදි.** ලෝක මූල්‍ය අර්බුදයේ බලපෑම හේතුවෙන් ස්වභාවික රබර් මිල ගණන් පහත වැටීමේ තත්ත්වය හමුවේ රබර් වගාකරුවන් වෙත අනුග්‍රහයක් ලෙස, ඔවුන්ට අවම වශයෙන් රබර් කිරි කිලෝ ග්‍රෑමයකට රුපියල් 175 ක මිලක් සහතික කිරීම සඳහා 2009 වසරේ දී රජය විසින් සහතික මිල ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. මේ යටතේ, රුපියල් මිලියන 25 ක මුදලක් කුඩා රබර් වතු හිමියන් 3,131 දෙනෙකුට ලබාදෙන ලදී. මේ අතර, සම්ප්‍රදායික රබර් වගා ප්‍රදේශවල (හෙක්ටයාර 715), මෙතෙක් රබර් වගා නොකරන ලද ප්‍රදේශවල (හෙක්ටයාර 441) රබර් අළුතින් වගාකිරීම සඳහා සහනාධාරයක් වශයෙන් රුපියල් මිලියන 138 ක මුදලක් ලබාදුන් අතර රුපියල් මිලියන 209 ක මුදලක් හෙක්ටයාර 1,002 ක ප්‍රදේශයක රබර් නැවත වගාකිරීම සඳහා ලබාදුණි.

**2009 වසර තුළ දී පොල් පර්යේෂණ ආයතනය, පොල් වගා කිරීමේ මණ්ඩලය, හා පොල් සංවර්ධන අධිකාරිය විසින් පොල් වගා ක්ෂේත්‍රයේ සැලකිය යුතු වර්ධනයක් සහතික කර ගැනීම පිණිස ව්‍යාපෘති කිහිපයක්ම දියත් කරන ලදි.** දකුණු පළාතේ පොල් ගස් 332,000ක් (එම පළාතේ පොල් වගාවෙන් සියයට 15 ක් පමණ) පමණ වැලිගම කොළ මැලවීමේ රෝගය හා කොළ කුණුවීමේ රෝගයන්ගේ බලපෑමට හසුවිය. පොල් පර්යේෂණ ආයතනය පොල් වගාකිරීමේ මණ්ඩලය හා එක්ව මෙම රෝගයන් දිවයිනේ සෙසු ප්‍රදේශවලට ව්‍යාප්ත වීම වැළැක්වීමට හා රෝගයේ දැඩි බලපෑමට හසු වූ ප්‍රදේශවල රෝගය මර්ධනය කිරීම සඳහා අදාළ ක්‍රියාමාර්ගයන් දියත් කළේය. මේ අතර, පොල් වගාකිරීමේ මණ්ඩලය 2009 වසර තුළ දී පොල් සංවර්ධන

වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. මේ අනුව, මෙම වසර තුළ හෙක්ටයාර 3,020 ක ඉඩම් ප්‍රමාණයක පොල් නැවත වගා කළ අතර, හෙක්ටයාර 3,945 ක ඉඩම් ප්‍රමාණයක පොල් අලුතෙන් වගාකිරීමට කටයුතු කරන ලදී. එසේම, වසර තුළ පොල් බීජ මිලියන 1.7 ක පමණ ප්‍රමාණයක් වගා කිරීම සඳහා බෙදා හැරීම ද සිදු විය. පොල් සංවර්ධන අධිකාරිය විසින් පොල් භාවිතයේ දී සිදුවන නාස්තිය පිළිබඳව සිදුකරන ලද අධ්‍යයනයකට අනුව ගෘහස්ථ පොල් පරිභෝජනයේදී පොල්වලින් සියයට 35 ක් පමණ ප්‍රමාණයක් කාර්යක්ෂම ලෙස පොල් කිරි නිස්සාරණය නොකිරීමේ හේතුවෙන් අපතේ යන බවත්, එය වාර්ෂිකව පොල් ගෙඩි මිලියන 500-530 ක පමණ ප්‍රමාණයක් බවත්, අනාවරණය කරන ලදී.

**එසේම, මෙම වසර තුළ අපනයන බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති ගණනාවක්ම ක්‍රියාත්මක කරන ලදී.** ගම්මිරිස්, කොකෝවා, කුරුඳු සහ කෝපි වතු වගා අංශය තුළ සහ උතුරු නැගෙනහිර පළාත්වල ව්‍යාප්ත කිරීම මෙන්ම උසස් තත්ත්වයේ රෝපන ද්‍රව්‍ය සැපයීම සහ ව්‍යාප්ත සේවාවන් පවත්වාගෙන යාම මෙම ව්‍යාපෘති අතර විය.

**සානුබල ක්‍රියා මාර්ගයන් සහ පැවති හිතකර මිල ගණන් සමඟ වී වගා ක්ෂේත්‍රය මෑතකාලීනව පුනර්ජීවයක් පෙන්නුම් කර ඇත.** ගොවීන්ට සාධාරණ මිලක් ලැබීම සහතික කරමින් නාඩු කිලෝ ග්‍රෑම් 1 ක් රුපියල් 28 කට සහ සම්බා කිලෝ ග්‍රෑම්1 ක් රුපියල් 30 කට මිලදී ගැනීමේ රජයේ වී මිලදී ගැනීමේ වැඩ සටහන නොකඩවා ක්‍රියාත්මක විය. මෙම වැඩ සටහන යටතේ 2009 වසරේදී වී මෙට්‍රික් ටොන් 50,439 ක් මිලදී ගැනීමට රුපියල් මිලියන 1,429ක් වැය කළ අතර එය වෙළෙඳපොළ මිල ගණන් අභිමත මට්ටමේ තබා ගැනීමට උපකාරී විය.

**දේශීය ආහාර නිෂ්පාදනය වැඩි කිරීමේ ජාතික වැඩ පිළිවෙල වන "අපි වවමු - රට නගමු" වැඩ සටහන 2009 වසරේදී ද නොකඩවා ක්‍රියාත්මක විය.** වර්ෂය තුළදී පුරන් කුඹුරු ඉඩම් අක්කර 75,752 යළි වගාවට යොදාගත් අතර, මෙට්‍රික් ටොන් 91,000 ක පමණ වී නිෂ්පාදනයක් එමගින් ජාතික නිෂ්පාදනයට එකතු විය. තවද, ගෙවතු වගා සංවර්ධන වැඩ සටහන යටතේ රටපුරා ගෙවතු 300,000 ක් සංවර්ධනය කරන ලදී. එළවළු හා පළතුරුවල පසු අස්වනු හානිය අඩු කිරීමෙහි අරමුණින් ගොවීන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර ප්ලාස්ටික් ඇසුරුම් 45,000 ක් බෙදා හරින ලදී.

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වසර තුළදී පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතීන්, ව්‍යාප්ති සේවාවන්, බීජ නිෂ්පාදන සහ තත්ත්ව වැඩි දියුණු කිරීමේ වැඩ සටහන් ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී.** ඉතා කෙටි කාලීන වී ප්‍රභේද (මාස 2 1/2) සඳහා ඉහළ යමින් පවතින ඉල්ලුම සපුරාලීමට සහල් පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් බීජ නිෂ්පාදන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී. හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 9 කට වඩා ඉහළ ඵලදාවක් සහිත කෘමි හානි හා රෝගවලට මෙන්ම පාරිසරික බලපෑම්වලට ඔරොත්තු දෙන මාස 3 1/2 හි වී ප්‍රභේදයක් වගාව සඳහා නිකුත් කරන ලදී. "MI ග්‍රීන්" සහ "ගල්කිරියාගම වරණය" යන නව මිරිස් ප්‍රභේද දෙකක්ද, "දඹුල්ල වරණය" නමින් දියුණු කරන ලද නව ලොකු ළූණු ප්‍රභේදයක් ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළදී වගාව සඳහා නිකුත් කරන ලදී. වසර තුළදී උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් අත්පත් කරගත් කැපී පෙනෙන ජයග්‍රහණයක් වන්නේ පැපොල් ශාකයට වැළදෙන පිටි මකුණු රෝගය විදේශ රටකින් ලබාගත් පරපෝෂිතයකුගේ උපකාරයෙන් ජීව විද්‍යාත්මකව පාලනය කරමින් පිටි මකුණන් ව්‍යාප්ත වීම සැළකිය යුතු ප්‍රමාණයකින් අඩු කිරීමයි.

**අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගා කිරීම තුළින් ගොවීන්ට සාපේක්ෂව ඉහළ මූල්‍ය ප්‍රතිලාභ ලබාගත හැකි නමුත් විවිධ හේතූන් නිසා වර්තමාන නිෂ්පාදන මට්ටම ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් නැත.** මෙම බෝගවල මිලගණන් වල සිදුවන ඉහළ විචලනය දේශීය වගාකරුවන් සඳහා ලබාදිය යුතු ආරක්ෂණයේ ප්‍රමාණය පිළිබඳව ස්ථාවර ප්‍රතිපත්තියක් පැවතීමේ ඇති වැදගත්කම ඉස්මතු කර ඇත. අඩු ඵලදායිතාව, ඉහළ නිෂ්පාදන පිරිවැය, ගුණාත්මක බීජ ප්‍රමාණවත්ව නොපැවතීම, කෘමි සහ රෝග බහුලවීම, අලෙවිකරණයේ පවතින දුර්වලතා සහ ගබඩා කිරීමේ පහසුකම් අවම වීම මෙම ක්ෂේත්‍රයේ වර්ධනයට බාධාවක්ව පවතී. 2009 වසරේ දී පසු අස්වනු තාක්ෂණික ආයතනය ලොකු ළූණු ගබඩා කර තැබිය හැකි නව සැකැස්මක් ඉදිරිපත් කළ අතර එතුළින් ලොකු ළූණු වගාවේ මාස 3 කට පසු අස්වනු හානිය සියයට 12 දක්වා අඩු කරගත හැකි බව පෙන්වා දෙන ලදී. සාම්ප්‍රදායික ගබඩා කිරීමේ පහසුකම් යටතේ මෙම පසු අස්වනු හානිය සියයට 30 සිට සියයට 50 දක්වා ඉහළ අගයක් ගනු ලැබිණ.

**වී සහ කුඩා තේ වතු හා රබර් වතු හිමියන් ආවරණය වන පරිදි සහන මිලට පොහොර ලබාදීමේ වැඩ සටහන 2009 වසරේදී ද අඛණ්ඩව සිදු කරන ලදී.** වී නිෂ්පාදනය සඳහා සියලුම වර්ගයේ පොහොර කිලෝ ග්‍රෑම් 50 ක මල්ලක් රුපියල් 350 ක් වැනි මිලකට නිකුත්

**විශේෂ සටහන 3**

## ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය

ආහාර සුරක්ෂිතතාව යන සංකල්පය ජාතික හා ගෝලීය මට්ටමින් සාමාන්‍යයෙන් නිර්වචනය කෙරෙනුයේ, “සැමට ආහාර” සපයා ගත හැකිවීම යනුවෙනි. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් “ක්‍රියාකාරී හා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගතකිරීම සඳහා සියලුම ජනතාවට අවශ්‍ය ආහාර සැමවිටම ප්‍රමාණවත්ව ලබාගත හැකි බව” ආහාර සුරක්ෂිතතාවය ලෙස නිර්වචනය කරමින් ආහාර පහසුවෙන් ලබාගැනීමට ඇති හැකියාව අවධාරණය කරයි (1996)[1]. ඇත්ත වශයෙන්ම, රට තුළින්ම නිපදවීමෙන් හෝ ආනයනය කිරීමෙන් හෝ ආහාර රට තුළ පැවතීම පමණක් ප්‍රමාණවත් නොවේ. රටක ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමට අත්‍යවශ්‍ය වන්නේ ජනතාවට එම ආහාර ලබාගත හැකි වීමයි. තවද, ආහාර සුරක්ෂිතතාවයේ අරමුණ වන්නේ සමාජයෙහි වෙසෙන සියළුම ජනතාවගේ සාගින්න සහ මන්දපෝෂණය තුරන් කිරීමයි. ඒ අනුව, ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ සංකල්පය මූලික කරුණු දෙකක් අවධාරණය කරයි. එනම්, ප්‍රමාණවත් පෝෂණයෙන් යුත් ආරක්ෂිත ආහාරවල සුලභතාවය සහ එම ආහාර ලබාගැනීමට ඇති හැකියාව යන්නයි.

### ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවයේ වර්තමාන තත්ත්වය

වර්තමානයේ දී ශ්‍රී ලංකාවට අවශ්‍ය ආහාරවලින්, එනම්, ධාන්‍ය, මාංශබෝග, මාළු හා මස්, එළවළු හා පළතුරු ආදියෙන් වැඩිපුර කොටසක් රට තුළ නිෂ්පාදනය කරයි. විශේෂයෙන්ම, රටේ ප්‍රධාන ආහාරය වන සහල් අවශ්‍යතාවයෙන් සාමාන්‍ය වශයෙන් සියයට 95 ක පමණ ප්‍රමාණයක් රට තුළම නිෂ්පාදන කරන අතර ඉතිරිය ආනයනය කරනු ලබයි. තිරිඟු අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම ආනයනය මගින් සපුරා ගැනේ. ඇතැම් මත්ස්‍ය නිෂ්පාදන, එනම්, ටින් මාළු හා කරවල ආනයනය කරන නමුත්, ආහාර සුරක්ෂිතාවයේ පෝෂණමය වශයෙන් වැදගත් සංඝටකයක් වන අළුත් මාළු අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම පාහේ රට තුළින්ම නිෂ්පාදනය කෙරේ. වර්තමාන සමස්ත දේශීය කිරි නිෂ්පාදනය මගින් සපුරාලන්නේ ජාතික කිරි අවශ්‍යතාවයෙන් ආසන්න වශයෙන් සියයට 30 ක් පමණි. බඩ ඉරිඟු, කඩල සහ වෙනත් ධාන්‍ය/මාංශබෝග සහ අර්තාපල්, මිරිස්, ලොකු ළූණු වැනි වෙනත් බෝගයන් රට තුළම නිෂ්පාදනය කිරීමට හැකියාව ඇතත් ඒවායෙහි වර්තමාන දේශීය නිෂ්පාදන මට්ටම එම බෝගයන්ගේ ජාතික අවශ්‍යතාවය සපුරාලීමට තරම් ප්‍රමාණවත් නොවේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, රටේ ආහාර අවශ්‍යතාවයෙන් කොටසක් ආනයනයන් තුළින් සපුරාගනු ලබයි.[2]

දේශීය නිෂ්පාදනය වැඩි වීම හෝ ආනයනය ජාතික ආහාර සැපයුම ඉහළ නංවනු ඇත. කෙසේ වෙතත්, අඩු ආදායම් තත්ත්වය හා මූලික ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් දිළිඳු පවුල්වලට ඔවුන්ගේ මූලික ආහාර ද්‍රව්‍ය ලබාගැනීමට නොහැකි වුවහොත් කුටුම්භ ආහාර සුරක්ෂිතතාවය ළඟාකර ගැනීම අසීරු වෙයි. දිළිඳුකම අඩුකර ගැනීමෙහි ලා කාලයත් සමඟ ශ්‍රී ලංකාව සැලකිය යුතු දියුණුවක් අත්පත් කරගෙන ඇත. වසර 2000 දී සියයට 22 ක් වූ දිළිඳු කුටුම්භ ප්‍රතිශතය හා සසඳන විට 2007 දී එය සියයට 15.2 දක්වා අඩු වී ඇත. එසේ වුවත්, දිවයිනෙහි ඇතැම් ප්‍රදේශවල හා වතු අංශයෙහි මෙම අනුපාතය සියයට 27 සිට සියයට 34 දක්වා පමණ ඉහළ අගයක් ගනී. එම නිසා, ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය වැඩි දියුණු කිරීම උදෙසා දිළිඳුකම අඩු කිරීමේ ප්‍රයත්නයන් අඛණ්ඩව පවත්වාගැනීම අවශ්‍ය වෙයි.

**සංඛ්‍යා සටහන වි. ස. 3.1 ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්ගේ ආහාර ශේෂ පත්‍රය**

| අයිතමය | 2005 | | | 2008 | | |
|---|---|---|---|---|---|---|
| | නිෂ්පාදනය (මෙ.ටො.000) | ආනයන (මෙ.ටො.000) | ඒක පුද්ගල ආහාර සුලභතාවය (වසරකට කි.ග්‍රෑ) | නිෂ්පාදනය (මෙ.ටො. 000) | ආනයන (මෙ.ටො. 000) | ඒක පුද්ගල ආහාර සුලභතාවය (වසරකට කි.ග්‍රෑ) |
| සහල් (වී) | 2.349 | 76 | 101 | 3,875 | 124 | 123 |
| බඩඉරිඟු | 42 | 147 | 3 | 113 | 83 | 2 |
| තිරිඟු | - | 842 | 42 | - | 541 | 26 |
| ළූණු | 109 | 121 | 8 | 107 | 174 | 9 |
| සීනි | 54 | 444 | 24 | 38 | 563 | 29 |
| අර්තාපල් | 79 | 41 | 5 | 75 | 99 | 7 |
| මාළු | 163 | 4 | 4 | 319 | 9 | 6 |
| එළකිරි | 137 | - | 4 | 146 | - | 4 |
| පොල්තෙල් | 20 | - | 1 | 59 | - | 2 |

මූලය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සමාන ආදායම් මට්ටම් සහිත බොහෝ රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ මූලික සෞඛ්‍ය දර්ශකයන් එම රටවලට වඩා යහපත් තත්ත්වයක පවතී. එසේ නමුත්, ශ්‍රී ලංකාවේ මන්දපෝෂණය පිළිබඳ ඇතැම් දර්ශකයන් තවමත් ඉහළ මට්ටමක පවතියි. ශ්‍රී ලංකා ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණයට (2006-2007) අනුව, ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 5 ට වඩා අඩු

1. ලෝක ආහාර සමුළුව 1996, (FAO)
2. 2007, 2008 හා 2009 වසර වල රටේ සමස්ත ආනයනයන්ගේ ප්‍රතිශතයක් ලෙස ආහාර ආනයනය පිළිවෙළින් සියයට 7.4, 8.1, 9.7 ක් විය.

ළමුන්ගෙන් සියයට 18 ක් වයසට අදාළ උසින් අඩු බවත්, සියයට 15 ක් උසට අනුව තිබිය යුතු බරට වඩා අඩු බවත්, සියයට 22 ක් අදාළ වයසට තිබිය යුතු බර නොමැති බවත්, සියයට 4 ක් උග්‍ර ලෙස බර අඩු බවත්, පෙන්වා දී ඇත.[3] එසේම, දිනකට ආහාරවලින් ලබාගතයුතු අවම කැලරි ප්‍රමාණයට වඩා අඩු කැලරි ප්‍රමාණයක් ලබන ජනගහණය සියයට 51 ක් තරම් සැළකිය යුතු ඉහළ අගයක් ගනියි (2006-2007)[4].

**ආහාර සුරක්ෂිතාවය ඉහළ නැංවීම කෙරෙහි වන රජයේ ප්‍රතිපත්තිය**

රජයෙහි දස අවුරුදු ප්‍රතිපත්ති රාමුව මගින්, කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. ඒ අනුව, කැලරි සහ ප්‍රෝටීන පාරිභෝජනය වැඩි කිරීමට සහ ආහාර ප්‍රමාණවත්ව පැවැතීම සහතික කිරීම සඳහා දායකත්වය සපයන ප්‍රධාන සාධකය ලෙස ජනතාවගේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය සහතික කරමින් දේශීය නිෂ්පාදනය දිරිගැන්වීමට රජය විසින් "අපි වවමු - රට නගමු" නමින් ජාතික මට්ටමේ වැඩසටහනක් ක්‍රියාවට නංවන ලදී. මෑත කාලයේ සහල් නිෂ්පාදනයෙහි සිදුවූ සීඝ්‍ර වර්ධනයට රජයෙහි සහයෝගය ඇතිව ක්‍රියාත්මක වූ මෙම දීප ව්‍යාප්ත වැඩ සටහන යටතේ වගා කළ වී බිම් ප්‍රමාණය පුළුල් වීම හේතු විය. 2009 වසර පමණක් ගත් විට, දේශීය නිෂ්පාදිතයට, ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් 91,000 ක දායකත්වයක් ලබාදෙමින් පුරන් කුඹුරු අක්කර 75,752 ක් වගාකරනු ලැබ ඇත. කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා දිරි දීමනා සහ සහනයන්ද ලබා දී තිබේ.

බඩ ඉරිඟු ආනයනය සඳහා සීමාවන් පැනවීම වැනි ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග හරහා ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමට මෙන්ම අවශ්‍ය අවස්ථාවලදී ඇතැම් භාණ්ඩවලට බදු නිදහසක් ප්‍රදානය කරමින් (උදා: තිරිඟු ඇට ආනයනය) ආනයනයන් දිරි ගැන්වීම සඳහා ද රජය සිය බදු ප්‍රතිපත්තිය භාවිතා කරයි. මෙයට අමතරව, වී මිලදී ගැනීම සඳහා යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙමින් ගොවීන්ට වී සඳහා අවම මිලක් ලැබීම සහතික කිරීම හරහා ඔවුන් වී වගාවෙහි නියැලීම ධෛර්යමත් කිරීමට රජය විසින් කටයුතු කරන ලදී. ඇතැම් වර්ගවල සහල් හා කිරි පිටි ඇතුළත් සමහර අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහාද රජය විසින් උපරිම සිල්ලර මිල ගණන් නියමකරනු ලැබීය.

රටේ ආහාර අනාරක්ෂිත තත්ත්වයක් ඇතිවීම වැළැක්වීම සඳහා ආහාර බෙදාහැරීම, අලෙවිකරණය හා ගබඩා කිරීම සම්බන්ධයෙන් ද රජය මැදිහත් විය. වෙළෙඳපොළෙහි ඇතිවිය හැකි කිසියම් සහල් හිඟයකට පිළියමක් ලෙසින් රජයෙහි ජාතික වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ ආරක්ෂිත සහල් තොග පවත්වාගෙන යාම හා අවශ්‍ය අවස්ථාවලදී සහල් ආනයනය කිරීම, සමුපකාර සමිති ජාලය ව්‍යාප්ත කිරීම සහ "ලක් සතොස" අලෙවි මධ්‍යස්ථාන හා ආර්ථික මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම වැනි දෑ මේ අතර විය. මෙයට අමතරව, රජය ග්‍රාමීය මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීමට හා ග්‍රාමීය ජන ජීවිතය නගා සිටුවීමට "මග නැගුම" සහ "ගම නැගුම" වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කළ අතර, කෘෂිකාර්මික අංශය සඳහා වැඩිපුර ණය පහසුකම් ලබාදීමට වාණිජ බැංකු යොමු කිරීම ද සිදුකරන ලදි. ඒ අනුව, 2009 වසරේ දී වාණිජ බැංකු විසින් කෘෂිකාර්මික අංශය සඳහා ලබාදුන් ණය හා අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 129.9 දක්වා සියයට 11.5 කින් වර්ධනය විය. ආහාර සුරක්ෂිතතාවය සහ ජීවන වියදම පාලනය කිරීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා මුලසුන දරන අමාත්‍ය මණ්ඩල උප කමිටුවක් ද රජය විසින් පත් කරන ලදි. රටෙහි ආහාර පිළිබඳ තත්ත්වය, වෙළෙඳපොළෙහි පවත්නා මිල ගණන් වෙනස්වීම් සහ වෙනත් ගැටළු සමාලෝචනය කරමින් එම අංශවල ඇතිවන ගැටළු විසඳීම සඳහා නිර්දේශයන් සිදු කිරීමට මෙම කමිටුව නිරන්තරව රැස්විය. කුටුම්භ ආහාර සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම සඳහා රජය විසින් රට පුරා ගෙවතු වගාව ප්‍රචාරණය කරමින් ගෙවතු 300,000 ක් පමණ 2009 වසර තුළදී සංවර්ධනය කර ඇති අතරම, දේශීය නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල් ව්‍යාපාර පදනම මත අතහැර තිබූ හිඟුරාණ සහ කන්තලේ සීනි කර්මාන්තශාලා වැනි කෘෂි නිෂ්පාදන කර්මාන්ත නගා සිටුවීමට සාධනීය ලෙස දායක විය.

මේ අතර, "සමෘද්ධි" ආදායම් ආධාරක වැඩසටහන් මෙන්ම ගර්භනී මව්වරුනට පෝෂණ මල්ලක් සැපයීම, අඩු ආදායම්ලාභී පවුල්වල වයස අවුරුදු 2 සිට 5 දක්වා ඌණ පෝෂක දරුවන්ට නැවුම් එළකිරි ලබාදීම, පාසැල් ළමුන්ගේ පෝෂණ වැඩසටහන් ආදිය ඇතුළත් විවිධ සුභසාධන හා සහන සැලසීමේ වැඩසටහන් සමාජයේ පෝෂණය පිළිබඳ අවදානමට ලක්ව ඇති ජන කොටස් වල මන්දපෝෂණය ගැටළුවට පිළියමක් ලෙස රජය විසින් ක්‍රියාත්මක කරන ලදි.

**අභියෝග, ගැටළු සහ ඉදිරි දැක්ම**

තම ආදායමින් සාපේක්ෂ වශයෙන් ඉහළ ප්‍රතිශතයක් ආහාර සඳහා වියදම් කරන විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුල්වල ආහාර සුරක්ෂිතතාවයට ඉහළ යන ආහාර මිල ගණන් අඛණ්ඩවම බරපතල අභියෝගයක් මතු කරයි. තවද,

3. ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2008. (පිටු අංක 82)
4. ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

නැවත වරක් ජාත්‍යන්තර බොර තෙල් මිළ ගණන් ඉතා ඉහළ මට්ටමකට ළඟා වුවහොත්, ජීව ඉන්ධන නිෂ්පාදනයට ධාන්‍ය සඳහා ඇති ඉල්ලුම ඉහළයාමත් සමඟ ලෝක ධාන්‍ය මිල ඉහළයාම සඳහා බලපෑමක් ඇති විය හැකිය. බලශක්ති මිල ගණන් ඉහළ යාම තුළින් කෘෂිකාර්මික භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය ඉහළයාම හරහා භාණ්ඩ මිල ගණන්වල ඉහළයාමකට මඟ පාදනු ඇත. තවද, කෘෂිකර්මාන්තය සඳහා කාලගුණය තීරණාත්මක සාධකයක් ලෙස සෑම විටම ක්‍රියාකරයි. මේ නිසා කාලගුණික වෙනස්වීම් වැනි අහිතකර බලපෑම්වලට මුහුණ දීම සඳහා විශේෂයෙන්ම, කුඩා පරිමාණ කෘෂිකාර්මික නිෂ්පාදකයින්ට වඩා දියුණු ජල කළමනාකරණ ශිල්පක්‍රම හඳුන්වාදීම සහ නව කෙටි කාලීන දෙමුහුන් බීජ ප්‍රභේද ඔවුන් අතර ප්‍රචලිත කිරීම අවශ්‍ය වේ.

ආදායම් වැඩිවීමත් සමඟ, අළුතින් සංවර්ධනය වන රටවල ආහාර පුරුදු ධාන්‍ය වැනි ප්‍රධාන ආහාරවල සිට මස් සහ කිරි වැනි පශු සම්පත් නිෂ්පාදනවලට යොමු වීම අපේක්ෂා කළ හැකිය. ශ්‍රී ලංකාව ද දැන් අඩු මධ්‍යම ප්‍රමාණයේ ආදායම් සහිත නැගී එන රටක් ලෙස වර්ගීකරණය කෙරේ. මෙහිදී ඇතිවන ආර්ථික වර්ධනයත් සමඟ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව නගර කරා යොමු වෙමින් නාගරීකරණය වේගවත් කරයි. එමනිසා අළුතින් ඇතිවන පරිභෝජනය හා භාණ්ඩ සැපයුම අතර පරතරය සපුරාලීම සඳහා, කෘෂිකාර්මික නිෂ්පාදන හා පශු සම්පත්වල නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය ආයෝජනයන් සිදුකිරීම අත්‍යවශ්‍ය වේ.

තවද, විශේෂයෙන්ම සහල් සඳහා වෙළෙඳපොළෙහි ඇතිවන හිඟයන්ට මුහුණදීම සඳහා අවස්ථානුකූල හා සුදුසු ක්‍රියාමාර්ග හඳුන්වාදීමේ අරමුණෙන් යුතුව, අදාළ රාජ්‍ය ආයතනවලට රට තුළ පවත්නා ධාන්‍ය තොග පිළිබඳව අඛණ්ඩව තක්සේරු සිදුකිරීමට හා ප්‍රමාණවත් තොග පවත්වා ගැනීමට ඉඩකඩ ලබාදීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් හඳුන්වාදීම අවශ්‍ය වේ. මේ අතර, කෘෂිකාර්මික අංශයේ වර්ධනය වේගවත් කිරීම සඳහා වාරි ජලය ලබාගැනීමේ හැකියාව සහ වෙනත් ආධාරක සේවාවන් එනම්, ගබඩාකරණය හා ආහාර සැකසුම් තාක්ෂණය, ප්‍රවාහන පහසුකම්, පසු අස්වනු හානි අවම කිරීම, බැංකු ණය ලබාගැනීමට ඇති හැකියාව වැඩිදියුණු කිරීම යනාදිය අවශ්‍ය වේ.

ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීමට හැකි වනු ඇත්තේ, ආහාර නිෂ්පාදනයේ තිරසාර වර්ධනය, මිල ස්ථායීතාවය පවත්වා ගැනීම සහ අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් මට්ටම ඉහළ නැංවීම මගින් පමණි. රජයේ වර්තමාන කාෂිකාර්මික ප්‍රතිපත්තිය අඛණ්ඩව ඉදිරියට රැගෙන යන අතරම සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන් හරහා ඉතා දිළිඳු කුටුම්භවලට ආහාර ලබා ගැනීමේ ඇති හැකියාව වැඩිදියුණු කිරීම මෙබඳු ප්‍රතිඵලයක් අත්කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රධානතම අඩිතාලම විය යුතුය.

කළ අතර, කුඩා තේ වතුහිමියන් සහ රබර් වතු හිමියන් සඳහා මිශ්‍ර පොහොර මල්ලක් රුපියල් 1,000 ක මිලකට ලබාදෙන ලදි. 2009 වසරේදී රජය විසින් සහන මිලට පොහොර ලබාදීමේ වැඩ සටහන යටතේ 2008 වසරේ වැය කළ රුපියල් බිලියන 26 ට සාපේක්ෂව රුපියල් බිලියන 27 ක් වැය කර ඇත. (මෙහි 2009/10 මහ කන්නයෙහි පොහොර සඳහා දැරූ පිරිවැයෙන් කොටසක් ද ඇතුළත්ය.) 2008/2009 මහ කන්නයෙහි වගාකළ බිම් ප්‍රමාණයෙහි ඉහළයාම හේතුවෙන්, මෙම වැඩ සටහන යටතේ එම කන්නයෙහි නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 242,093 දක්වා සියයට 9 කින් ඉහළ ගිය අතර, 2009 යළ කන්නයෙහි වගාකළ බිම් ප්‍රමාණය පහළයාම හේතුවෙන් එම කන්නයෙහි නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 150,375 දක්වා සියයට 32 කින් පහළ ගොස් ඇත. වී වගා ක්ෂේත්‍රය තුළ සහන මිලට පොහොර බෙදාහැරීමේ ක්‍රමයන්හි පවතින අකාර්යක්ෂමතාවයන් ඉවත් කරන අතරම විධිමත් ව්‍යාප්ති වැඩසටහන් හරහා තුලිත පොහොර භාවිතය දිරිගැන්වීම ද අවශ්‍යය. කෙසේ නමුත්, තේ සඳහා පොහොර සහනාධාරය වැඩි කිරීම හේතුවෙන් කුඩා තේ වතු හිමියන්ගේ පොහොර භාවිතය වැඩිවීම නිසා තේ අංශයෙහි වාර්ෂික පොහොර භාවිතය මෙට්‍රික් ටොන් 172,680 දක්වා සියයට 31 ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇත.

**ගැටුම් පැවති ප්‍රදේශවල කිරි ගව පාලන හා මත්ස්‍ය නිෂ්පාදන අංශවල සංවර්ධනයට රජය විශේෂ අවධානයක් යොමු කර ඇත.** උතුරු පළාතෙහි කිරි ගව පාලන අංශය ධෛර්යමත් කිරීමට කෙටිකාලීන හා මැදිකාලීන සංවර්ධන වැඩසටහනක් පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් දියත් කරන ලදි. ඒ යටතේ ගොවීන්ට සතුන් බෙදාදීම, පශු සම්පත් අභිජනන සමූපකාර සමිති ශක්තිමත් කිරීම හා ප්‍රතිසංවිධානය කිරීම, කිරි එකතු කිරීමේ ජාලය ප්‍රතිසංවිධානය කිරීම, පුහුණු වැඩසටහන්, පශු වෛද්‍ය විමර්ෂණ මධ්‍යස්ථාන, නව කිරි එකතු කිරීමේ සහ කිරි ශීතකරණ මධ්‍යස්ථාන සහ පශු අභිජනන ගොවිපොළවල් මෙයට ඇතුළත් විය. ඉස්සන් ගොවිපොළ කර්මාන්තයේ සංවර්ධනය ඉලක්ක

කර ගනිමින් "නැගෙනහිර නවෝදය" වැඩසටහන යටතේ විවිධ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාවට නැංවිණි. බෝට්ටු සහ ධීවර ආම්පන්න යළි පදිංචි වූ ධීවරයන් අතර බෙදාහැරීම, යාපනය, වෙල්ෆ් සහ කරෙයිනගර් යන ප්‍රදේශවල මත්ස්‍ය අලෙවි මධ්‍යස්ථාන තුනක් ඉදිකිරීම, මන්නාරම සහ පෙරියකුඩා යන ප්‍රදේශවල ධීවර වරාය සංවර්ධනය කිරීම යනාදී ව්‍යාපෘතීන් "උතුරු වසන්තය" වැඩසටහන යටතේ නිම කරමින් උතුරු පළාතේ ධීවර කර්මාන්තය යළි ස්ථාපිත කිරීම සඳහා ද ක්‍රියා කළේය.

අපනයන හා දේශීය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ අංශ ගණනාවක් කෙරෙහි තවදුරටත් අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. අපනයන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තේ, පොල්, රබර් නැවත වගා කිරීම හා අළුතින් වගා කිරීමේ කටයුතු දැනට සිදුකරන වේගය එම ක්ෂේත්‍රයන්ගේ ඉදිරි පැවැත්ම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් එම කටයුතු කඩිනම් කළ යුතු වේ. ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදනවල මිල ගණන් කෙරෙහි අනාගත කම්පනයන්ගෙන් ඇති විය හැකි බලපෑම අවම කර ගැනීම සඳහා ස්ථායිකරණ අරමුදල් පිහිටුවීම වැදගත් වේ. කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ ඵලදායිතාවය හා ආයෝජනය ඉහළ නැංවීම සඳහා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, නව තාක්ෂණික ක්‍රම යොදා ගැනීම (බින්දු ජල තාක්ෂණය, පාලනය කරන ලද ජල ඉසීමේ උපක්‍රම සහ තෝරාගත් බෝග සඳහා ආරක්ෂිත ගෘහ තුළ ජල කළමනාකරණය යොදාගැනීම), ඉහළ තාක්ෂණය භාවිතා කළ හැකි සෑම අවස්ථාවන්හිදීම යන්ත්‍ර භාවිතා කිරීම ආදිය වැදගත් වේ. කිරි, පළතුරු, එළවළු, මත්ස්‍ය හා මත්ස්‍ය ආශ්‍රිත එකතු කළ වටිනාකම වැඩි කෘෂි නිෂ්පාදන අපනයන ඉහළ නැංවීම සඳහා ආහාර සැකසුම් තාක්ෂණය ඇසුරුම්කරණය හා පසු අස්වනු තාක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා ආයෝජනය කිරීම අවශ්‍ය වේ. ප්‍රමුඛතා පදනම යටතේ වැඩි දියුණු කළයුතු ක්ෂේත්‍රයන් අතරට ගොවීන්ට වඩා උසස් බීජ මිලදී ගැනීමට ඉහළ වියදමක් දැරීමට සිදුවන බැවින් ඔවුන්ගේ ගොවිපලවල්වල දීම තත්ත්වයෙන් උසස් බීජ නිෂ්පාදනය කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම, වැඩි දියුණු කරන ලද දෙමුහුන් බීජ වෙළෙඳපොලෙන් ලබා ගත හැකිවීම, අතිරික්ත අස්වැන්න අස්වනු රහිත කාලයන්හිදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ගබඩාකිරීමේ පහසුකම් වැඩි දියුණු කිරීම සහ ගොවීන්ට බැංකු ණය ලබා ගැනීම සඳහා වැඩි ඉඩකඩ සලසා දීම ඇතුළත් වේ.

### කාර්මික අංශය

**2008 වසරේ දී සියයට 5.9 කින් වර්ධනය වූ කාර්මික අංශය 2009 වසරේ දී සියයට 4.2 කින් වර්ධනය විය.** පතල් හා කැණීම්, නිෂ්පාදන කර්මාන්ත සහ ඉදිකිරීම් යන උප අංශවල වර්ධන වේගයන් පෙර වසරට වඩා මන්දගාමී විය. කෙසේ වුව ද, විදුලිය, ගෑස් සහ ජලය උප අංශය පෙර වසරට වඩා වැඩි වර්ධන වේගයක් වාර්තා කර ඇත. 2009 වසරේ දී ද.දේ.නි.යට කාර්මික අංශයෙහි දායකත්වය 2008 දී සියයට 28.4 සිට, සියයට 28.6 දක්වා ආන්තික වශයෙන් වැඩි විය.

**නිෂ්පාදන කර්මාන්ත අංශයේ නිමැවුමෙන් සියයට 90 කට වඩා වැඩි දායකත්වයක් සපයන කර්මාන්තශාලා නිෂ්පාදන අංශය 2008 වසරේ දී වාර්තා කළ සියයට 5.0 ක වර්ධනයට සාපේක්ෂව 2009 වසරේ දී සියයට 3.4 කින් වර්ධනය විය.** දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොළ තුළ කාර්මික නිෂ්පාදිත සඳහා වන ඉල්ලුම අඩුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩය හැර කර්මාන්තශාලා නිෂ්පාදන අංශය තුළ තිබෙන සියලුම ප්‍රධාන කාණ්ඩයන් 2009 වසරේ දී පහළ වර්ධන අනුපාතිකයක් පෙන්වීය. ගෝලීය ආර්ථික පසුබෑසීම ජාත්‍යන්තර වෙළෙඳපොළ ඉල්ලුම අඩු වීමට සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. ප්‍රධාන වශයෙන්ම, වැයකළ හැකි ආදායම අඩුවීම සහ දේශීය ආර්ථික කටයුතුවල පහත බැසීම හේතුකොටගෙන දේශීය ඉල්ලුම ද අඩු විය. කෙසේ වෙතත්, අපනයන

**2.7 සංඛ්‍යා සටහන** **කර්මාන්තයන්හි එකතු කළ අගය (2002 ස්ථාවර මිල අනුව)**

| කාණ්ඩය | රු. මිලියන | | වෙනස(%) | |
|---|---|---|---|---|
| | 2008(අ) | 2009(ආ) | 2008(අ) | 2009(ආ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 174,794 | 185,142 | 5.2 | 5.9 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 87,215 | 87,762 | 3.1 | 0.6 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 1,085 | 1,125 | 2.3 | 3.7 |
| 4. කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම හා මුද්‍රණය කිරීම | 1,598 | 1,635 | 6.3 | 2.3 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 58,650 | 59,706 | 6.4 | 1.8 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 15,306 | 14,794 | 5.2 | -3.3 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 958 | 965 | 3.0 | 0.7 |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 31,702 | 32,794 | 5.6 | 3.4 |
| 9. කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 1,907 | 2,004 | 11.2 | 5.1 |
| **එකතුව** | **373,215** | **385,927** | **5.0** | **3.4** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික


මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සිදුකෙරෙන ප්‍රධාන රටවල් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම, අලුතින් නිදහස් කර ගන්නා ලද උතුරු සහ නැගෙනහිර පළාත් වලින් මෙන්ම මතුවෙමින් පවතින හිතකර ආර්ථික පරිසරය හේතුකොටගෙන දේශීය ඉල්ලුම ඉහළ යාමෙහි ප්‍රතිඵලයක් ලෙස 2009 දෙවන භාගයේ සිට කර්මාන්තශාලා අංශය සැළකිය යුතු ලෙස යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළේය.

**අපනයන සහ දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් කර්මාන්ත යන දෙඅංශයම 2009 වසර තුළ දී මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය.** අපනයන ඉලක්ක කරගත් කර්මාන්තවල නිමැවුමට ප්‍රධාන වශයෙන්ම දායක වන ඇඟළුම්, රබර් ආශ්‍රිත නිෂ්පාදිත, දියමන්ති සැකසීම, මැණික් සහ ස්වර්ණාභරණ, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ කර්මාන්ත 2009 වසර තුළ දී අඩු වර්ධන වේගයක් වාර්තා කළ අතර, ප්‍රධාන වශයෙන්ම දේශීය වෙළෙඳපොළ ඉලක්ක කරගත් ආහාර සහ පාන වර්ග කර්මාන්ත 2009 වසරේ දෙවන භාගය තුළ දී සැළකිය යුතු ලෙස වර්ධනය විය. 2009 වසරේ අග භාගය වනවිට ඉදිකිරීම් උප-අංශය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීම සිමෙන්ති සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තවල නිමැවුම සාපේක්ෂ වශයෙන් ඉහළයාම තුළින් පිළිබිඹු කළේය.

**කර්මාන්තශාලා නිමැවුමින් සියයට 46 කට වඩා වැඩි දායකත්වයක් සපයන ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩය 2008 වසරේ දී වාර්තා කළ සියයට 5.2 ක වර්ධනයට සාපේක්ෂව 2009 වසරේ දී සියයට 5.9 කින් වර්ධනය විය.** උතුරු සහ නැගෙනහිර පළාත්වල වෙළෙඳපොළ පුළුල්වීම සහ සංචාරක කර්මාන්තයේ ක්‍රියාකාරීත්වය ඉහළයාම නිසා ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත කාණ්ඩය යටතේ ගැනෙන සියලුම ප්‍රධාන කර්මාන්ත මේ සඳහා විශාල දායකත්වයක් සපයනු ලැබීය. 2009 වසර තුළ දී බිස්කෝතු, පාන වර්ග, කිරි සහ පොල් ආශ්‍රිත නිෂ්පාදිත සහ සැකසූ ආහාර නිෂ්පාදිත කර්මාන්ත ඔවුන්ගේ වෙළෙඳපොළ පුළුල් කිරීමේ වැඩසටහන් නොකඩවා පවත්වමින් දේශීය හා විදේශීය වෙළෙඳපොළ ආකර්ෂණය කර ගැනීමට වටිනාකමක් එකතු කළ ඉහළ තත්වයේ නිෂ්පාදිත පෙළක් වෙළඳපොළට හඳුන්වාදෙනු ලැබීය. "සහලට මුල් තැන" වැඩසටහන යටතේ, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය **(MID)** දේශීය සහල් පරිභෝජනය ඉහළ නැංවීමට සහ සහල් පිටි වලින් සැකසූ බේකරි නිෂ්පාදිත ප්‍රවර්ධනය කිරීමට සහල් පිටි නිෂ්පාදිත ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. උතුරු සහ නැගෙනහිර පළාත්වල කර්මාන්තශාලා නවීකරණය කිරීම, නව කර්මාන්තශාලා

**2.3 රූප සටහන** **කර්මාන්තයන්හි එකතු කළ අගය-2009 (2002 ස්ථාවර මිල අනුව)**




සහ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන විවෘත කිරීම හරහා කිරි නිෂ්පාදන කර්මාන්තයේ ධාරිතාවය පුළුල් කරනු ලැබීය. රජය විසින් ගෙනගිය මත්ද්‍රව්‍ය සහ දුම්කොළ විරෝධී වැඩසටහන්වල දායකත්වය තුළින් මත්ද්‍රව්‍ය සහ දුම්කොළ නිෂ්පාදිතවල නිමැවුම දිගින් දිගටම අඩු විය. සංචාරක කටයුතු සහ වෙළෙඳපොළ පුළුල්වීම කඩිනම් වීමත් සමගම ආහාර සහ පාන වර්ග කර්මාන්තය 2010 සහ ඉන් ඉදිරියට වැඩි වේගයකින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත කර්මාන්ත කාණ්ඩය 2009 වසරේ දී ආන්තික වර්ධනයක් පෙන්නුම් කළේය.** ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ඉල්ලුම අඩු වීම සුළු හා මධ්‍ය පරිමාණ ඇඟළුම් නිෂ්පාදකයන්ට අහිතකර ලෙස බලපෑවේය. බැංකු ණය ලබාදීමේ දී වඩාත් සුපරීක්ෂාකාරී වීම, ඉහළ පොලී අනුපාතිකයන් පැවැතීම සහ බැංකු සුරැකුම්වල අවශ්‍යතාවය යනාදියත් මෙම කර්මාන්තවලට බලපෑවේය. ඒ අතර, ඇඟළුම් කර්මාන්තයෙහි ප්‍රමුඛයෝ ඉහළ තත්ත්වයෙන් යුතු නිෂ්පාදිත, ලොව පිළිගත් වෙළෙඳ නාමයන් යටතේ නිපදවමින්, භාණ්ඩ නියමිත වේලාවට සපයමින් අපනයන වෙළෙඳපොළ තුළ කීර්ති නාමය පවත්වාගෙන ගිය අතර එමගින් තම තරඟකාරීත්වය තවදුරටත් රැක ගැනීමට සමත් වූහ. හරිත නිෂ්පාදිතවලට වැඩි අවධානය යොමු කිරීම, සුවිශේෂිත වෙළෙඳපොළවලට වැඩි වශයෙන් යොමුවීම සහ ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන ගෝලීය ආර්ථික පරිසරය 2009 වසර අග භාගයේ දී ඇඟළුම් කර්මාන්තය නැවත යථා තත්ත්වයට පත්වීමට දායක විය.

**2009 වසරේ දී රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත කාණ්ඩය 2008 වසරේ දී වාර්තා කළ සියයට 6.4 ක වර්ධනය සමඟ සැසඳීමේ දී සියයට 1.8 ක අඩු වර්ධනයක් වාර්තා කළේය.** විශාලතම උප-කාණ්ඩය සහ අපනයන ඉලක්ක කරගත් දෙවන විශාලතම කර්මාන්තය ලෙස ගැනෙන රබර් ආශ්‍රිත නිෂ්පාදිතවල නිමැවුම අඩුවීම ප්‍රධාන වශයෙන් ම මෙම කාණ්ඩයේ මන්දගාමී ක්‍රියාකාරිත්වයට හේතු විය. ගෝලීය ආර්ථික පසුබෑම සහ නිෂ්පාදන පිරිවැය ඉහළයාම මගින් තරඟකාරීත්වය අඩුවීම රබර් ආශ්‍රිත කර්මාන්තයෙහි ක්‍රියාකාරීත්වයට බලපෑ ප්‍රධාන බාධකයන් විය. ඇමෙරිකා එක්සත් ජනපදයේ කර්මාන්තශාලාවල දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් ඝන ටයර් සඳහා ඉල්ලුම සැලකිය යුතු ලෙස පහත බැසීමක් වාර්තා කළේය. 2009 වසරේ දී ඉදිකිරීම් උප-අංශයේ පසුබෑම 2009 වසරේ දී ප්ලාස්ටික්, පී.වී.සී සහ තීන්ත කර්මාන්තවල නිමැවුම කෙරෙහි බලපෑමක් ඇති කළේය. කෙසේ වෙතත්, ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟම 2009 වසරේ සිව්වන කාර්තුවේ දී රබර් ආශ්‍රිත නිෂ්පාදිතවල නිමැවුම වර්ධනය විය. රබර් ආශ්‍රිත නිෂ්පාදිත සඳහා පවතින විභවතාවය හඳුනාගනිමින් ලොව සිව්වන විශාලතම ටයර් නිෂ්පාදිත සමාගම දේශීය ඝන ටයර් නිෂ්පාදකයෙක් සමඟ හවුල් ව්‍යාපාරයක් සඳහා ශ්‍රී ලංකාවේ ආයෝජනය කළේය.

**ඉදිකිරීම් උප-කාණ්ඩයෙහි පසුබෑම හේතුකොට ගෙන සිමෙන්ති සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්තවල ප්‍රධාන දායකත්වයෙන් යුතු ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත කාණ්ඩයේ නිමැවුම 2009 වසරේ දී සියයට 3.3 කින් පහත වැටුණි.** වෙළෙඳපොළ නැවත ග්‍රහණය කර ගැනීම සඳහා අලංකරණය සහ නවීන තාක්ෂණය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් සුවිශේෂිත වෙළෙඳපොළ ආකර්ෂණය කරගැනීමට පිඟන් සහ බිත්ති ගඩොල් කර්මාන්තය විසින් නව නිෂ්පාදිත පෙළක් වෙළෙඳපොළට නිකුත් කරන ලදි. උතුරු සහ නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කිරීම් සහ ප්‍රතිසංස්කරණ කටයුතු නොකඩවා සිදු කිරීම, රාජ්‍ය අංශය තුළ මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පෞද්ගලික අංශයේ ඉදිකිරීම් කටයුතු නැවත යථා තත්ත්වයට පත්වීම සහ ණය මුදල් සඳහා පිරිවැය අඩුවීම යනාදිය මෙම කර්මාන්තවල වර්ධනයට අනුබලයක් වනු ඇත. 2009 වසරේ දී කෑම මේස උපකරණ සහ සකස්කළ දියමන්ති මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත සඳහා පැවැති ඉල්ලුමේ අඩුවීම, අපගේ වෙළෙඳ ගනුදෙනු කරන ප්‍රධාන රටවල් ආර්ථික අර්බුදයෙන් මිදී යථා තත්ත්වයට පත්වීමත් සමගම වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2009 වසරේ දී සකස් කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ කාණ්ඩයේ වර්ධනය අඩු විය.** වෙළෙඳ ගනුදෙනු සිදු කරන ප්‍රධාන රටවල ඇති වූ තීව්‍ර ආර්ථික පසුබෑම, දේශීය ඉල්ලුම අඩුවීමත්, නැව් සහ බෝට්ටු නිපදවීම, විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික උපකරණ එකලස් කිරීමේ කර්මාන්තවලින් සමන්විත මෙම අංශයේ නිමැවුම වර්ධනයට බලපෑමක් ඇති කළේය. වසරේ අවසාන භාගයේ දී උතුරු සහ නැගෙනහිර පළාත් වලින් ඇති වූ ඉල්ලුම ඉහළ යාම හේතුකොටගෙන ධීවර බෝට්ටු නිපදවීමේ කර්මාන්තයට යම් වාසිදායක තත්ත්වයක් ඇති විය. ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු යථා තත්ත්වයට පත්වීමේ ප්‍රවණතාවයත් සමඟ ඉදිරියේ දී නැව් නිපදවීමේ සහ අළුත්වැඩියා

**2.8 සංඛ්‍යා සටහන** **ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් ලාභ අනුපාතික (අ)**

| කාණ්ඩය | මුළු නිෂ්පාදන පිරිවැය (රු. මිලියන) | | මුළු නිෂ්පාදන වටිනාකම (රු. මිලියන) | | කම්හල් ලාභ අනුපාත (ප්‍රතිශතය) | |
|---|---|---|---|---|---|---|
| | 2008(ආ) | 2009(ඇ) | 2008(ආ) | 2009(ඇ) | 2008(ආ) | 2009(ඇ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 120,090 | 131,619 | 140,703 | 154,492 | 14.7 | 14.8 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 32,209 | 35,591 | 36,789 | 40,284 | 12.4 | 11.6 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 2,479 | 2,791 | 2,812 | 3,166 | 11.9 | 11.9 |
| 4. කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම හා මුද්‍රණය කිරීම | 8,058 | 8,945 | 9,200 | 10,203 | 12.4 | 12.3 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 62,234 | 72,067 | 73,519 | 84,767 | 15.3 | 15.0 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 38,388 | 44,914 | 44,872 | 51,962 | 14.4 | 13.6 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 4,026 | 4,492 | 4,689 | 5,209 | 14.2 | 13.8 |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 24,077 | 27,810 | 28,034 | 32,183 | 14.1 | 13.6 |
| 9. කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 4,855 | 5,467 | 5,546 | 6,234 | 12.5 | 12.3 |
| **එකතුව** | **296,416** | **333,695** | **346,164** | **388,501** | **14.4** | **14.1** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 515 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**2.9 සංඛ්‍යා සටහන**

**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල දේශීය පිරිවැය ව්‍යුහය (අ)**
**(මුළු නිෂ්පාදන පිරිවැයෙහි ප්‍රතිශතයක් ලෙස)**

| කාණ්ඩය | බලය සහ ඉන්ධන | | වැටුප් | | අමුද්‍රව්‍ය | | පොලිය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2008 | 2009(ආ) | 2008 | 2009(ආ) | 2008 | 2009(ආ) | 2008 | 2009(ආ) |
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 4.1 | 3.8 | 10.5 | 10.7 | 40.1 | 40.8 | 1.8 | 2.1 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 5.4 | 5.2 | 15.4 | 15.5 | 13.6 | 13.8 | 3.0 | 3.4 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 10.0 | 10.2 | 16.5 | 16.7 | 33.3 | 33.6 | 4.8 | 5.0 |
| 4. කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම හා මුද්‍රණය කිරීම | 4.8 | 4.9 | 13.2 | 13.3 | 19.8 | 20.2 | 3.9 | 4.2 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 7.5 | 7.1 | 13.8 | 13.9 | 31.2 | 31.5 | 4.2 | 4.4 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 21.6 | 21.4 | 15.4 | 15.5 | 29.8 | 30.1 | 4.1 | 4.5 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 10.6 | 10.3 | 11.3 | 11.1 | 36.5 | 36.4 | 2.8 | 2.9 |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 5.9 | 5.7 | 12.8 | 12.9 | 27.4 | 27.6 | 4.7 | 5.2 |
| 9. කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 5.9 | 5.8 | 12.3 | 12.2 | 34.8 | 35.0 | 1.9 | 2.1 |
| **එකතුව** | **7.2** | **7.0** | **12.7** | **12.8** | **33.2** | **33.5** | **3.0** | **3.3** |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 515 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කිරීමේ කර්මාන්තයේ වර්ධනයක් අපේක්ෂා කෙරේ. මෙම කාණ්ඩය යටතේ ඉහළ වර්ධන ප්‍රවණතාවයක් ඇති, මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය, සූර්ය බලයෙන් පණ ගැන්වෙන විද්‍යුත් යතුරු පැදි 2009 වසරේ දී දේශීය වෙළෙඳපොළට හඳුන්වා දෙන ලදි. ජාත්‍යන්තර සහ දේශීය වෙළෙඳපොළ තුළ විශාල ලෙස වර්ධනය වීමේ හැකියාවක් පවතින විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික කර්මාන්තවල වර්ධනය සඳහා, කාර්මික විවිධාංගීකරණය සිදු කිරීම සහ වැඩි වශයෙන් ආයෝජනය කිරීම අවශ්‍ය වේ.

**ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ, ඛනිජ තෙල් පිරිපහදුවේ නිමැවුම අඩුවීම හේතුකොටගෙන 2009 වසරේ දී රාජ්‍ය අංශයේ කාර්මික නිමැවුම 2008 වසර සමඟ සැසඳීමේ දී පසුබැසීමක් වාර්තා කළේය.** වසර කිහිපයක සිට රාජ්‍ය අංශයේ නිමැවුමට ප්‍රධාන දායකත්වයක් සපයන ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, 2009 වර්ෂයේ දී රාජ්‍ය අංශයේ නිමැවුමට සියයට 95 කට වඩා වැඩි දායකත්වයක් සපයනු ලැබීය. කෙසේ වෙතත්, සීමාසහිත ජාතික කඩදාසි සමාගම, රාජ්‍ය දැව සංස්ථාව සහ රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව, 2009 වසර තුළ දී ධනාත්මක වර්ධනයක් වාර්තා කළේය. රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුව රාජ්‍ය අංශයේ කර්මාන්ත ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව සීමාසහිත ජාතික කඩදාසි සමාගමේ කටයුතුවල තාක්ෂණික වැඩි දියුණුවක් සිදුකළ අතර, කාර්යයන් නිසිලෙස ව්‍යුහගත කිරීමට අවශ්‍ය පියවර ද ගනුලැබීය. වසා දමා තිබූ කඩදාසි කර්මාන්තශාලා නැවත විවෘත කර රාජ්‍ය ආයතනවල කඩදාසි අවශ්‍යතාවයන් සපුරාලීමට ඉඩ සලසන ලදි. ගෝලීය ඉල්ලුම අඩුවීම ලංකා ඛනිජ වැලි සමාගමේ නිමැවුමට බලපෑම් ඇති කළේය.

**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල නිමැවුම් ලාභ අනුපාතිකය 2009 වසරේ දී සියයට 2.1 කින් අඩු විය.** අමුද්‍රව්‍ය, මූල්‍ය සහ වැටුප් පිරිවැය ඉහළයාම මධ්‍යයේ විකුණුම් ප්‍රමාණය අඩුවීම ප්‍රධාන වශයෙන්ම 2009 වසරේ දී ලාභදායිත්වය අඩුවීමට බලපෑවේය. කාර්මික අංශයේ ප්‍රමුඛ ආයතන විසින් ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාවය වැඩි කිරීම, නිසි අයුරින් ක්‍රියාකාරී කටයුතු සිදු කිරීම, අලෙවිකරණ පිරිවැය අවම කිරීම සහ යම් සහායක සේවාවන් බාහිර ආයතන වලින් ලබා ගැනීම ආදිය තුළින් නිෂ්පාදන පිරිවැය අඩු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග රාශියක් ගනුලැබීය. දේශීය සහ විදේශීය වෙළෙඳපොළ වර්ධනය වීමත් සමඟම 2009 වසරේ තුන්වන කාර්තුවේ සිට කර්මාන්තවල ලාභ මට්ටම් නැවත යථා තත්ත්වයට

**2.10 සංඛ්‍යා සටහන**

**ආයෝජන මණ්ඩලයට අයත් නොවන පෞද්ගලික අංශයේ කර්මාන්තවල ශ්‍රම ඵලදායීතා දර්ශකය (අ)**

1995=100

| කාණ්ඩය | 2008 | 2009 (ආ) | වෙනස (%) |
|---|---|---|---|
| 1. ආහාර, පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදිත | 142.4 | 146.0 | 2.5 |
| 2. රෙදිපිළි, ඇඟළුම් සහ සම් නිෂ්පාදිත | 125.7 | 127.6 | 1.5 |
| 3. දැව හා දැව නිෂ්පාදිත | 111.0 | 114.0 | 2.7 |
| 4. කඩදාසි නිෂ්පාදිත, ප්‍රකාශනය කිරීම හා මුද්‍රණය කිරීම | 111.4 | 114.0 | 2.3 |
| 5. රසායනික ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල්අඟුරු, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදිත | 155.4 | 159.4 | 2.6 |
| 6. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත | 122.7 | 123.8 | 0.9 |
| 7. මූලික ලෝහ නිෂ්පාදිත | 109.6 | 110.8 | 1.1 |
| 8. සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ | 135.8 | 139.1 | 2.4 |
| 9. කාර්මික නිෂ්පාදිත (අන් තැනක සඳහන් නොවූ) | 120.3 | 122.9 | 2.2 |
| එකතුව | 132.1 | 134.7 | 2.0 |

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ නොවන පෞද්ගලික අංශයේ ආයතන 515 කින් ලැබී ඇති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පත්වීම ඇරඹිණි. නව බඳවාගැනීම් ප්‍රමාද කිරීම, කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීම් අවම කිරීම සහ අතිකාල වැඩ සීමා කිරීම මඟින් කර්මාන්තකරුවෝ වැටුප් පිරිවැය අවමකර ගනිමින් කාර්යක්ෂමතාවය වැඩිකර ගැනීමට ක්‍රියා කළහ. ඉන්ධන භාවිතය හා ඉන්ධන මිල ගණන් අඩුවීමත් සමඟම බලශක්තිය සහ ඉන්ධන සඳහා වන පිරිවැය මුළු කර්මාන්තශාලා පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස ගත්කළ 2009 වසරේ දී සියයට 2.8 කින් අඩු වූ අතර, දේශීය අමුද්‍රව්‍ය සඳහා පිරිවැය සියයට 0.9 කින් වර්ධනය විය.

**අවිනිශ්චිත ගෝලීය වාතාවරණය මඟින් ඇතිකරන ලද අභියෝගයන්ට මුහුණදීමට ශ්‍රී ලාංකික නිෂ්පාදකයන් නව සහ සුවිශේෂිත කුඩා වෙළෙඳපොළ කෙරෙහි මෙන්ම නිෂ්පාදිත විවිධාංගීකරණය පිළිබඳව ද අවධානය යොමු කරමින් ඒ සඳහා අවශ්‍ය කාලීන සහ පූර්ව ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබීය.** විශේෂයෙන්ම, ඇඟළුම් අංශයේ නිෂ්පාදකයන් විසින් පරිසර හිතකාමී නිෂ්පාදන යාන්ත්‍රණවලට සහ අන්තර්ජාතික කම්කරු ප්‍රමිතීන්වලට අනුගත වීම තුළින් තම නිෂ්පාදිත අනෙකුත් ඇඟළුම් නිෂ්පාදිත වලින් වෙන්කර දැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනුලැබීය. අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ අත්නොවන වෙළෙඳ ගිවිසුම් මත දැඩිලෙස විශ්වාසය තැබීම කර්මාන්තකරුවන්ගේ තිරසාර පැවැත්මට හිතකර නොවන බැවින් තරගකාරීත්වය, නිෂ්පාදිත ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය යනාදිය වර්ධනය කිරීම අවශ්‍ය වේ.

**2009 වසරේ දී රජය විසින් ප්‍රාදේශීය කාර්මීකකරණය සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් කාර්මික අංශයේ සංවර්ධනය සඳහා සක්‍රීයව දායක විය.** රජය විසින් රාජ්‍ය මූල්‍ය සහන සැපයීම, මූල්‍ය සහ තාක්ෂණික සහයෝගිතා ලබාදීම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි කාර්මික ජනපද පිහිටුවීම මෙන්ම විශේෂයෙන් උතුරු සහ නැගෙනහිර පළාත්වල වසා තිබූ කර්මාන්තශාලා නැවත විවෘත කිරීම පිළිබඳව අවධානය යොමුකිරීම තුළින් ප්‍රදේශ අතර සමබර කාර්මික සංවර්ධනයකට එමඟින් නොකඩවාම දායකත්වය සපයනු ලැබීය. කර්මාන්ත ප්‍රාදේශීය වශයෙන් ව්‍යාප්ත කිරීම පිළිබඳව අවධානය යොමු කරමින් "ගමට කර්මාන්ත" සහ "නිපැයුම් ශ්‍රී ලංකා - කර්මාන්තශාලා 300 වැඩසටහන" වැනි විශේෂ වැඩසටහන් රාශියක් රජය විසින් ක්‍රියාත්මක කරන ලදි. 2009 අවසානය වනවිට "ගමට කර්මාන්ත" වැඩසටහන යටතේ ව්‍යාපෘතීන් 132 ක් අනුමත කරන ලද අතර එයින් කර්මාන්ත 46 ක් වාණිජ කටයුතු ආරම්භ කර ඇති අතර තවත් කර්මාන්ත 33 ක් කර්මාන්ත ආරම්භ කිරීමේ විවිධ අදියරවල පවතී. රජය විසින් අලුතින් නිදහස් කර ගන්නා ලද උතුරු හා නැගෙනහිර පළාත්වල කාර්මික අංශයේ සංවර්ධනය සඳහා *"වඩක්කිල් වසන්තම්"* සහ "නැගෙනහිර නවෝදය" වැනි විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

**දේශීය හා විදේශීය ආයෝජකයන් දිරිමත් කිරීමට පිහිටුවන ලද කාර්මික ජනපද සහ විශේෂිත ආර්ථික කලාපවල කටයුතු විවිධ පළාත්වල ක්‍රියාත්මක වෙමින් පවතී.** කාර්මික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය කාර්මික සංවර්ධන වැඩසටහන යටතේ කාර්මික ජනපද පිහිටුවීමේ කටයුතු ශීඝ්‍රයෙන් ක්‍රියාවට නංවමින් පවතී. 2009 වසරේ දී ත්‍රිකුණාමලය (කප්පල්තුරෙයි) කාර්මික ජනපදයේ යටිතලපහසුකම් සංවර්ධන කටයුතු නිමකර ඇති අතර බුත්තල කාර්මික ජනපදයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු අවසන් වෙමින් පවතී. මේ අතර, ඇඹිලිපිටිය සහ ගලිගමුව කාර්මික ජනපදවල යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වලින් සැලකිය යුතු ප්‍රමාණයක් සම්පූර්ණකර ඇති අතරම, පල්ලෙගොඩවත්ත (මතුගම) සහ මාදම්පේ කාර්මික ජනපදවල මූලික කටයුතු ද ආරම්භ කොට ඇත. ව්‍යවසායකත්ව සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් හොරණ රෙදිපිළි සැකසුම් කලාපයේ මූලික කටයුතු අවසානකොට ඇති අතර අම්පාර, මඩකලපුව, හම්බන්තොට, පුත්තලම සහ ත්‍රිකුණාමලයේ පිහිටි විශේෂ ආර්ථික කලාප 5 ක වැඩකටයුතු අරඹා ඇත.

**2009 වසරේ දී කාර්මික අංශයේ සංවර්ධනය සඳහා ආයතනික සහාය නොකඩවා සපයනු ලැබීය.** ආයෝජන මණ්ඩලය විසින් "නිපැයුම් ශ්‍රී ලංකා" ප්‍රාදේශීය කාර්මීකකරණය වැඩසටහන යටතේ නව කර්මාන්ත 58 ක් පිහිටුවන ලද අතර අඩපණ වූ කර්මාන්ත 18 ක් යළි නඟා සිටුවීම ද කර්මාන්ත 5 ක කටයුතු පුළුල් කිරීම ද සිදුකරන ලදි. තවද කර්මාන්ත 8 ක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වලින් බැහැරව ස්ථානගත කිරීමට අනුමැතිය ලබාදෙන ලදි. අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) තවදුරටත් අපනයන වෙළෙඳපොළ ඉලක්ක කොටගත් කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළෙඳ සල්පිල්, ප්‍රදර්ශන, පුහුණු වැඩසටහන් සහ අනෙකුත් විවිධ ක්‍රියාකාරකම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදි. කෘෂිකර්මය පදනම් කරගත් කර්මාන්තවල එකතු කළ අගය වැඩිකිරීම සඳහා 2009 අයවැයේ සඳහන් පරිදි පළාත් නවයේ ම කෘෂි අපනයන කලාප පිහිටුවීමට අවශ්‍ය මූලික පියවර අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ගනු ලැබීය. 2009 වසරේ දී

ඇඟළුම් කර්මාන්ත ඒකාබද්ධ සංගමය (JAAF) විසින් දියත් කළ "පිළිගත් ආචාරධර්ම වලට අනුව නිමැ වූ ඇඟළුම්" *(Garments Without Guilt)* යන ගෝලීය අලෙවිකරණ වැඩසටහනේ තුන්වන අදියර ගෝලීය එෆී සම්මානය *(Global Effie Award)* දිනූ ප්‍රථම ආසියානු සන්නම් නාමය බවට පත්විය. තුල්හිරිය රෙදිපිළි උද්‍යානයේ පිහිටි, ඇඟළුම් නව නිපැයුම් සහ පුහුණු මධ්‍යස්ථානය (AITC), ඇඟළුම් කර්මාන්තයේ මානව සම්පත් සංවර්ධනය සඳහා නොකඩවා දායකත්වය සපයනු ලැබීය. අධික තාපයට භාජනය කරන ලද මැණික් ගල් වලින් ස්වභාවික මැණික් වෙන්කර හඳුනා ගැනීමේ පර්යේෂණ වාර්තා නිකුත් කිරීමට සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් වලට අනුකූලව දුර්ලභ මැණික් ගල් පිළිබඳව සහතික නිකුත් කිරීම සඳහා මැණික් පර්යේෂණ විද්‍යාගාරයක් පිහිටුවීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) විසින් අවශ්‍ය සියලුම වැඩකටයුතු අවසන් කර ඇත. මැණික් හා ස්වර්ණාභරණ අංශයේ වැදගත්කම හඳුනාගැනීමත් සමගම අමුද්‍රව්‍ය ආනයනය සඳහා බැංකු ගිණුම්වල ඇති විදේශ විනිමය ආදායමින් සියයට 50 ක් භාවිත කිරීමට අවසර ලබාදුන් අතර, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තවලට අවශ්‍ය ණය පහසුකම් පුළුල් කිරීම සඳහා බැංකු දිරිමත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය සඳහා ඇප යෝජනා ක්‍රමයක් හඳුන්වාදෙන ලදි.

**2009 වසරේ දී කාර්මික සංවර්ධන අමාත්‍යංශය, කාර්මික සේවා කාර්යංශයේ උපදේශක සේවා සහාය ද ඇතිව ඵලදායිතා වැඩිදියුණු කිරීමේ වැඩසටහනේ දෙවන අදියර නොකඩවාම ක්‍රියාත්මක කළේය.** ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් ඔවුන්ගේ වාර්ෂික ඵලදායිතා තරගය පවත්වනු ලැබීය. ගෝලීය මූල්‍ය අර්බුදය හේතුවෙන් රැකියා අහිමිවීම් පිළිබඳව ඉතා කඩිනමින් පිළියම් යෙදීම සඳහා අදාළ පාර්ශවයන්ගේ එකඟතාවයෙන් යෝජිත විරැකියා ප්‍රතිලාභ රක්ෂණ වැඩසටහන *(Unemployment Benefit Insurance Scheme)* යටතේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික පියවර ගැනීම කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශය විසින් සිදුකරනු ලැබීය.

**රජය විසින් ගෝලීය ආර්ථික අර්බුදය හමුවේ කාර්මික අංශයට සහ බලපෑමට ලක් වූ අනිකුත් අංශයන්ට විශේෂ සහනදායී පැකේජයක් ලබාදීමේ කාලීන පියවර ගනු ලැබීය.** මේ අනුව ඉහළ එකතු කළ වටිනාකමක් සහිත අපනයන භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත සඳහා පනවන ලද ආර්ථික සේවා ගාස්තුව වසරක කාලයක් සඳහා ඉවත් කරන ලදි. රබර් වගාකරන්නන්ගෙන් ලෙටෙක්ස් රබර් කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 150 ක් බැගින් වූ සහතික කළ මිලකට මිල දී ගැනීම සඳහා රබර් භාණ්ඩ නිෂ්පාදකයන්ට සහනයක් ලබාදෙන ලදි. ඒ අතර, 2008 වසරට සමාන හෝ ඊට වඩා වැඩි සේවක සංඛ්‍යාවක්, අපනයන ඉපැයීම් මට්ටමක් සහ එකතු කළ වටිනාකමක් පවත්වාගත් ඇඟළුම් සහ සම්භාණ්ඩ අංශයේ අපනයනකරුවන්ට අපනයන සහනාධාරයක් ලබා දෙන ලදි. තව ද, ලංකා විදුලිබල මණ්ඩලය විසින් අයකරන ලද ඉන්ධන ගැලපුම් ගාස්තුව 2009 වසරේ දී ඉවත් කරන ලදි.

**කාර්මික අංශයේ අභිවෘද්ධිය සඳහා නව නිපැයුම් සහ නව තාක්ෂණික ක්‍රම භාවිතය වෙනුවෙන් ආයෝජනය කිරීම අත්‍යවශ්‍ය වේ.** රජයේ හා පෞද්ගලික අංශයේ සහයෝගීත්වයෙන් යුතුව ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණික ආයතනය (SLINTec) පිහිටුවනු ලැබීමෙන් ශ්‍රී ලාංකීය නිෂ්පාදිතවල වටිනාකම වැඩිකිරීමට සහ ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තරගකාරීත්වය වැඩිකිරීමට උපකාරී වනු ඇත. පර්යේෂණ හා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රීය දැනුම, වාණිජ වටිනාකමින් යුක්ත නව නිපැයුම් සහ සේවා බවට පරිවර්තනය කිරීම මෙහි අරමුණ විය.

**2009 වසරේ දී සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැපයීම නොකඩවා සිදු කරනු ලැබීය.** සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත මුහුණපාන ගැටළු හඳුනාගැනීමට සහ එම අංශය දියුණු කිරීමට අවශ්‍ය නිර්දේශයන් ලබාදීම සඳහා ආසියානු සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සමුළුව-2009 පවත්වන ලදි. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට තරගකාරීවීම, සමාජ වගකීමෙන් යුතුවීම සහ පරිසර හිතකාමීවීම සඳහා අවශ්‍ය වන පුළුල් සේවා ජාලයක් සැපයීම ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FCCISL), විසින් නොකඩවා සිදුකරන ලද අතර කොළඹ සහ ඉන් බාහිර ප්‍රදේශවල තිබෙන සියළු අවශ්‍යතා එකම ස්ථානයකින් සපුරාගත හැකි මධ්‍යස්ථාන හරහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට උපකාරක සේවා සැපයීමට "ශ්‍රී ලංකාවේ කර්මාන්ත" (Enterprise Sri Lanka) නම් වූ වැඩසටහනක් දියත් කරන ලදි. ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව (IFC) විසින් දිස්ත්‍රික්ක වාණිජ මණ්ඩලවල සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කොටස්වල ව්‍යාපාරික කුසලතා වර්ධනය කිරීම සඳහා "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන කුටි" නමින් හඳුන්වන ව්‍යාපාරික කුටි ආරම්භ කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

**උතුරු සහ නැගෙනහිර පළාත් මුදාගැනීමත් සමගම එම ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දියුණු කිරීමේ අවශ්‍යතාවය වඩාත් වැදගත් වී ඇත.** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උතුරු පළාතේ ව්‍යවසායකයින්ට තම ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීමට අවශ්‍ය මූල්‍යමය සහයෝගීතාවය ලබාදීමට “උතුරු පිබිදීම” (Awakening North) නම් වූ විශේෂිත ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. ඒ අතර, ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් නව රැකියා අවස්ථාවන් බිහිකිරීම සහ පුළුල් කිරීම සඳහා නැගෙනහිර පළාත තුළ යන්ත්‍ර-සූත්‍ර සහ උපකරණ බෙදාදෙන ලදි. කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් නිෂ්පාදන ක්‍රියාවලිය දියුණු කිරීම සඳහා යාපනයේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. උතුරු සහ නැගෙනහිර පළාත්වල සුළු හා මධ්‍ය පරිමාණ, කර්මාන්තවලට ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු ආරම්භ කිරීමට සහ පුළුල් කිරීමට ඉතා වාසිදායක තත්ත්වයක් පවතී.

**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් පිහිට වූ ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව ඇතුළු අනෙකුත් ආයතන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයට අවශ්‍ය මූල්‍යමය හා තාක්ෂණික සහයෝගීතාවය ලබාදීම නොකඩවා සිදුකරන ලදි.** ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව කර්මාන්ත සංවර්ධන මණ්ඩලය සමග සහයෝගීතාවයෙන් යුතුව ග්‍රාමීය මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හෝ ස්වයං රැකියා හෝ අරඹා ඇති ව්‍යවසායකියන්ට අඩු පොලී “ලක්කම් ණය යෝජනා ක්‍රමය” දියත් කරන ලදි. ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව විසින් සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ තරුණ ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා “සියපත් පුබුදුව” නම් වූ තවත් ණය යෝජනා ක්‍රමයක් හඳුන්වාදෙන ලදි. ආසියානු සංවර්ධන බැංකුවේ වෙළෙඳ මූල්‍ය පහසුකම් සැපයීමේ වැඩසටහන යටතේ, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයේ දේශීය ආයතනවලට සහ ව්‍යවසායකයින්ට වෙළෙඳාම ගැන අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාගැනීමේ හැකියාවක් පවතී. තවද, අඩු උද්ධමනයත් සමඟ පොලී අනුපාතිකයන් පහළ බැසීම, බැංකු අංශයෙන් මූල්‍යමය සහයෝගීතාවය ලබාගැනීමට සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට උපකාරී විය.

**පතල් හා කැණීම් උප අංශය 2008 වසරේ දී වාර්තා වූ සියයට 12.8 ක වර්ධනයට සාපේක්ෂව 2009 වසරේ දී සියයට 8.2 කින් වර්ධනය විය.** මැණික් කැණීම් අංශය සියයට 17.2 කින් සංකෝචනය වූ අතර අනෙකුත් කැණීම් කටයුතු සියයට 18.1 කින් වර්ධනය විය. මහ බැංකුවේ වෙළෙඳ දර්ශකයෙහි මැණික් අපනයන පරිමාව සියයට 10.1 කින් පහත වැටීමෙන් මැණික් කැණීම් අංශයෙහි වූ පසුබෑම පිළිබිඹු වේ. ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි මැණික් සඳහා වූ ඉල්ලුම පහත වැටීම මෙයට හේතු වශයෙන් දැක්විය හැකිය.

**වතු වැවිලි බෝග, සකස් කළ නිෂ්පාදන මත පදනම් වූ කර්මාන්ත ඇතුළත් වන සැකසුම් උප අංශයෙහි පසුගිය වසරේ වාර්තා වූ සියයට 5.3 ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.7 ක තරම් අඩු වර්ධන වේගයක් වාර්තා විය.** ලෝක වෙළෙඳපොළෙහි අපනයන කෘෂිකාර්මික නිෂ්පාදනවලට බලපෑ අහිතකර තත්ත්වයන් හා අහිතකර කාලගුණික තත්ත්වයන් නිසා තේ නිෂ්පාදනය පහත වැටීම මෙම උප අංශයේ මන්දගාමීත්වයට හේතු විය.

**2008 වසරේ දී සියයට 4.5 කින් වර්ධනය වූ ගෘහ කර්මාන්ත උප අංශය 2009 වසරේ දී සියයට 3.3 ක වේගයකින් වර්ධනය විය.** කුඩා පරිමාණ ඉදිකිරීම්, නිමි ඇඳුම් හා අත්‍යන්ත්‍ර නිෂ්පාදන අඩු වීම, වී නිෂ්පාදනයේ ඇති වූ පසුබෑම නිසා වී ආශ්‍රිත ඇඹරුම් කර්මාන්තවල ක්‍රියාකාරකම් පහත වැටීම සහ සමස්තයක් ලෙස ආර්ථිකයේ ඇති වූ පසුබෑම ගෘහ කර්මාන්ත උප අංශයේ වර්ධනයට අහිතකර ලෙස බලපෑම් ඇති කළේය.

**විදුලිය, ගෑස් සහ ජලය උප අංශය, පසුගිය වසරේ ලැබූ සියයට 2.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 3.7 කින් වර්ධනය විය.** මෙම උප අංශය තුළ, විදුලිය උප අංශය සියයට 3.7 කින් වර්ධනය වී ඇත. වැඩි එකතු කළ වටිනාකමක් සහිත ජල විදුලිබල නිෂ්පාදනය සියයට 5.6 කින් පහත වැටුණ ද, මෙම අංශයේ වර්ධනයට හේතු වූයේ තාප විදුලිබල නිෂ්පාදනය සියයට 3.7 කින් වර්ධනය වීමෙන් ලැබූ දායකත්වයයි. බොරතෙල් මිල සාපේක්ෂ වශයෙන් අඩු වීම නිසා 2009 වසරේ දී තාප විදුලිබල ජනනයෙන් එක් වූ එකතු කළ වටිනාකම ඉහළ යාම මෙයට හේතු විය. ගෑස් උප අංශයෙහි එකතු කළ වටිනාකම සියයට 5.4 ක් විය. සමස්ත ගෑස් අලෙවිය පසුගිය වසරේ වූ සියයට 12.0 ක සංකෝචනයට සාපේක්ෂව සියයට 6.4 කින් ඉහළ ගියේය. ජලය උප අංශය ද, 2008 දී වාර්තා වූ සියයට 3.6 ක වර්ධනයට සාපේක්ෂව සියයට 2.9 කින් වර්ධනය විය. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් බෙදා හරින ලද ජල පරිමාව, පසුගිය වසරට සාපේක්ෂව සියයට 2.0 කින් වර්ධනය වී ඇත.

**ඉදිකිරීම් උප අංශය 2008 වසරේ වාර්තා කළ සියයට 7.8 ක වර්ධනයට සාපේක්ෂව 2009 වසරේ දී සියයට 5.6 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය.** රාජ්‍ය අංශයේ ඉදිකිරීම් ව්‍යාපෘති වන නොරොච්චෝලේ සහ

ඉහළ කොත්මලේ විදුලි බලාගාර, කොළඹ-කටුනායක සහ දකුණු අධිවේගී මාර්ගය, ගුවන් පාලම් ඉදිකිරීම් සහ "මග නැගුම" ව්‍යාපෘතිය යටතේ වූ වෙනත් ග්‍රාමීය මාර්ග පද්ධති දියුණු කිරීම මගින් ලැබූ දායකත්වය මෙම උප අංශයේ වර්ධනයට ධනාත්මකව දායක විය. කෙසේ වුව ද, මහ බැංකු වෙළෙඳ දර්ශකවලට අනුව ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන සියයට 24.1 කින් සංකෝචනය වීම මගින් නිවාස ඉදිකිරීම් පහත වැටීම නිසා මෙම උප අංශයේ ඇති වූ මන්දගාමීත්වය පිළිබිඹු වේ. නිවාස ගොඩනැගීම සඳහා නිකුත් කරන ලද ණය ප්‍රමාණය ද සියයට 1.5 කින් සංකෝචනය වී ඇත. සිමෙන්ති ආනයන සහ දේශීය සිමෙන්ති නිෂ්පාදනය පිළිවෙළින් සියයට 14.9 කින් සහ 7.4 කින් සංකෝචනය වීමෙන් ද සමස්තයක් ලෙස ඉදිකිරීම් අංශයේ කටයුතුවල පැවැති මන්දගාමීත්වය පිළිබිඹු විය.

**සේවා අංශය**

**දළ දේශීය නිෂ්පාදිතයට සියයට 59.3 ක් වූ විශාලතම දායකත්වයක් දක්වන සේවා අංශය 2008 දී වාර්තා වූ සියයට 5.6 ක වර්ධන වේගයට සාපේක්ෂව සියයට 3.3 කින් වර්ධනය විය.** සේවා අංශයෙහි ඇති වූ මන්දගාමී වර්ධනයට හේතු වූයේ විදේශීය වෙළෙඳ කටයුතුවල සිදු වූ පසුබෑමයි. මෙම පසුබෑම විශේෂයෙන්ම ආනයන වෙළෙඳාම් අංශයේ තීව්‍ර ලෙස දක්නට ලැබිණි.

**තොග සහ සිල්ලර වෙළෙඳාම් උප අංශයේ වර්ධනය 2008 දී වාර්තා වූ සියයට 4.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.3 කින් ආන්තික වශයෙන් පහත වැටිණි.** පිළිවෙළින් සියයට 6.6 කින් සහ සියයට 5.2 කින් සංකෝචනය වූ ආනයන සහ අපනයන වෙළඳාම් උප අංශ ඇතුළත් විදේශීය වෙළෙඳ අංශයෙහි පහත වැටීම මෙම පසුබෑස්මට හේතු විය. ලෝක ආර්ථික අර්බුදය නිසා ඉල්ලුම පහත වැටීම විදේශීය වෙළෙඳ අංශය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. කෙසේ වුව ද, දේශීය වෙළෙඳාම් උප අංශයේ ඇති වූ පුළුල් වීම එලෙසම පැවැතිණි.

**ආනයන වෙළෙඳාම් උප අංශය, 2008 වසරේ දී වාර්තා කළ සියයට 4.7 ක වර්ධනයට සාපේක්ෂව 2009 දී සියයට 6.6 කින් සංකෝචනය විය.** මහ බැංකු වෙළෙඳ දර්ශක අනුව පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ පරිමා පිළිවෙළින්, සියයට 5.0 කින්, සියයට 13.8 කින් සහ සියයට 6.4 කින් සංකෝචනය වීම මගින් සමස්ත සංකෝචනය නිරූපණය විය. මුළු ආනයනවල වටිනාකමින් සියයට 19.6 කට පාරිභෝගික භාණ්ඩ දායක විය. අන්තර් භාණ්ඩ අංශය තියුණු පහළ යෑමක් පෙන්නුම් කළ අතර, බොර තෙල් සහ තිරිඟු ආනයන පරිමා පිළිවෙළින් සියයට 11.5 කින් සහ සියයට 11.7 කින් ඉහළ ගොස් ඇත. මෙය, එම අංශය තුළ වූ අනෙකුත් සියළුම උප අංශවල වාර්තා වූ සංකෝචනයන්ට වඩා වෙනස් ප්‍රවණතාවකි. මේ අතර, මුළු ආනයන වටිනාකමින් සියයට 22.0 කට ආයෝජන භාණ්ඩ දායක විය. මහ බැංකු වෙළෙඳ දර්ශක අනුව ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන පරිමාව සියයට 24.1 කින් ද, ගමනාගමන උපකරණ පරිමාව සියයට 1.2 කින් ද අඩු වීමක් දක්නට ලැබිණි.

**විදේශීය වෙළෙඳපොළෙහි වූ අයහපත් ප්‍රවණතා හේතුවෙන් අපනයන වෙළෙඳාම් උප අංශය 2008 වාර්තා වූ 0.9 ක වර්ධනයට සාපේක්ෂව සියයට 5.2 කින් සංකෝචනය විය.** විශේෂයෙන්ම, තේ අපනයන පහත වැටීම හේතු කොට ගෙන සමස්ත කෘෂිකාර්මික අපනයන සියයට 5.9 කින් සංකෝචනය විය. කාර්මික අපනයන සියයට 13.9 කින් පහත වැටිණි. රෙදිපිළි හා ඇඟලුම් සහ අනෙකුත් කාර්මික අපනයන පරිමාවන් පිළිවෙළින්, සියයට 4.0 කින් සහ සියයට 31.4 කින් පහත වැටීම මෙයට හේතු විය. මැණික් අපනයන පරිමාව සියයට 10.1 කින් සංකෝචනය වූ නිසා සමස්ත ඛණිජ අපනයනය සියයට 8.8 කින් අඩු විය.

**දේශීය වෙළෙඳාම උප අංශය 2008 වසරේ දී ලැබූ සියයට 6.4 ක වර්ධනයට සාපේක්ෂව 2009 දී සියයට 7.0 කින් වර්ධනය විය.** අභ්‍යන්තර ගැටුම නිමා වීමත් සමඟ උතුරු හා නැගෙනහිර පළාත්වල ආර්ථික කටයුතුවල ඇති වූ ප්‍රබෝධයත් සමඟ දේශීයව නිපද වූ භාණ්ඩවලට ඇති වූ ඉල්ලුම වැඩි වීම මෙම වර්ධනයට දායකත්වයක් දැක්වීය.

**අභ්‍යන්තර ගැටුම් නිමා වීමත් සමඟ, හෝටල් සහ ආපනශාලා උප අංශය ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය විය. 2008 වසරේ දී සියයට 5.0 කින් සංකෝචනය වූ මෙම උප අංශය 2009 වසරේ දී සියයට 13.3 කින් වර්ධනය විය.** දේශීය සහ විදේශීය දෙඅංශයේම සංචාරක කටයුතුවල වර්ධනයක් පෙන්නුම් කරමින් එම අංශවල වූ සංචාරක රාත්‍රී සංඛ්‍යාව පිළිවෙළින්, සියයට 18.8කින් සහ සියයට 2.0 කින් වර්ධනය විය. සමස්තයක් ලෙස 2009 වසරේ දී විදේශීය සංචාරකයන්ගේ පැමිණීම 2008 වසරේ දී සිදු වූ සියයට 11.2 ක සංකෝචනයට සාපේක්ෂව සියයට 2.1කින් වර්ධනය විය.

**ප්‍රවාහනය සහ සන්නිවේදනය උප අංශ 2008 වසරේ දී ලබාගත් සියයට 8.1ක වර්ධනයට සාපේක්ෂව සියයට 6.6 කින් වර්ධනය විය.** පසුගිය වසර හා සසඳන විට වර්ධන වේගය මන්දගාමී වුව ද ප්‍රවාහන,

භාණ්ඩ මෙහෙයවීම වරාය සහ සිවිල් ගුවන් සේවා හා තැපැල් සහ විදුලි සංදේශ යන උප අංශ තුනම මෙම උප අංශයේ වර්ධනයට ධනාත්මකව දායක වී ඇත.

**2008 වසරේ දී සියයට 6.3 කින් වර්ධනය වූ ප්‍රවාහනය උප අංශය 2009 දී සියයට 6.0 කින් වර්ධනය වී ඇත.** මෙම වර්ධනයට හේතු වූයේ දුම්රිය ප්‍රවාහන හා මගී සහ භාණ්ඩ ප්‍රවාහනය උප අංශවල පිළිවෙළින් සියයට 4.3 කින් සහ සියයට 6.0 කින් වූ වර්ධනයයි. පෙට්‍රල් සහ ඩීසල් විකුණුම් පරිමාවන් පිළිවෙළින් සියයට 5.4 කින් සහ සියයට 6.0 කින් ඉහළ යාම මගින් ප්‍රවාහන උප අංශයේ ඇති වූ වර්ධනය පිළිබිඹු වේ. කෙසේ වුව ද, නව වාහන ලියාපදිංචි කිරීම් සියයට 23.1 කින් පහත වැටී ඇති බව වාර්තා විය. 2007 දී සහ 2008 දී නව වාහන ලියාපදිංචි කිරීම් පිළිවෙළින් සියයට 0.9 කින් සහ 11.0 කින් පහත වැටී ඇත. උතුරු හා නැගෙනහිර පළාත්වල සේවාවන් තරමක් දුරට යළි ආරම්භ කළ ද, දුම්රිය මගී ප්‍රවාහනයේ පසුබැස්ම මගී කිලෝමීටර් ගණන සියයට 2.2 කින් පහත වැටීම තුළින් පිළිබිඹු වේ.

**විදේශීය වෙළෙඳ අංශයේ ඇති වූ පසුබෑම මධ්‍යයේ වුව ද, භාණ්ඩ මෙහෙයවීම-වරාය සහ සිවිල් ගුවන් සේවා උප අංශය සියයට 3.4 කින් වර්ධනය විය.** 2008 වසරේ වාර්තා වූ සියයට 8.0 ක වර්ධනයට සාපේක්ෂව, මෙය මන්දගාමී වර්ධනයකි. කොළඹ වරාය මගින් අඩි විස්සට සමාන බහාලුම් ඒකක මිලියන 3.5 ක් මෙහෙයවූ අතර එය සියයට 6.0 ක අඩු වීමක් පෙන්නුම් කරයි. වරාය මගින් හසුරුවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය ද සියයට 3.6 කින් පහත වැටිණි. කෙසේ වුව ද, 2009 හතර වන කාර්තුවේ දී වරාය මෙහෙයුම් කටයුතුවල වූ ප්‍රවර්ධනයත් සමඟ මෙම උප අංශයේ ක්‍රියාකාරිත්වය යථා තත්ත්වයට පත් වන ලකුණු පෙන්නුම් කළේය.

**2008 දී තැපැල් හා විදුලි සංදේශ උප අංශයේ වාර්තා වූ සියයට 22.3 ක ඉහළ වර්ධනයට සාපේක්ෂව, එම අංශය 2009 දී සියයට 11.7 කින් වර්ධනය වී ඇත.** ඉතා තියුණු තරගකාරී තත්ත්වයක් යටතේ සේවා සැපයුම්කරුවන් විසින් දියත් කරන ලද නවතම සේවාවන්, කරගකාරී මිල මට්ටම් සහ මුදාගත් ප්‍රදේශවල සේවා ව්‍යාප්ත කිරීම් මෙම වර්ධන වේගය අත්පත් කර ගැනීමට ඉවහල් විය. වසර තුළ ජංගම දුරකථන සම්බන්ධතා සියයට 25.9 කින් වර්ධනය වූ අතර, ස්ථාවර, සංකේත විභේදුම් බහුවිධ ප්‍රවේශ තාක්ෂණ (CDMA) සහ ජංගම දුරකථන සම්බන්ධතා ඇතුළු මුළු ග්‍රාහක පදනම සියයට 19.6 කින් වර්ධනය විය. සමස්තයක් ලෙස දුරකථන ඝණත්වය, එනම් පුද්ගලයන් සියයකට අදාළව ගැනෙන දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව 2008 වසරේ දී 72 ක් වූ අතර, 2009 වසරේ දී එය 85 දක්වා වර්ධනය විය.

**බැංකු කටයුතු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් උප අංශය 2008 දී වාර්තා වූ සියයට 6.6 ක වර්ධනයට සාපේක්ෂව සියයට 5.7 කින් වර්ධනය විය.** මෙම වර්ධනය අත්පත් කරගනු ලැබූයේ ගෝලීය ආර්ථික අර්බුදය නිසා ඇති වූ සමස්ත දේශීය ආර්ථිකයේ ඇති වූ පසුබැස්ම හා නීති විරෝධී මූල්‍ය ආයතන කිහිපයක් බිඳ වැටීමත් සමඟ ඇති වූ අස්ථාවරත්වය මධ්‍යයේය. කෙසේ වුව ද, රටේ සාමකාමී තත්ත්වයත් සමඟ ගොඩනැගුණු ආයෝජකයන්ගේ විශ්වාසයත් සමඟ වසරේ අවසාන භාගය වන විට වෙළෙඳපොළෙහි වූ අස්ථාවර භාවය සමනය විය. මුදාගත් ප්‍රදේශවල ජනතාවට, මූල්‍ය ආයතනවල සේවාවන් සඳහා ප්‍රවේශය ලබා දීමට සැලකිය යුතු බැංකු ශාඛා සහ සේවා ස්ථාන ප්‍රමාණයක් පිහිටුවන ලදී. වෙළෙඳපොළ ද්‍රවශීලතාව වැඩි කිරීමට සහ ආයෝජන ධෛර්යමත් කිරීමට පොලී අනුපාත ද අඩු කරනු ලැබීය.

**රාජ්‍ය සේවා උප අංශය සියයට 5.9 කින් වර්ධනය වූයේ 2008 වසරේ දී වාර්තා වූ සියයට 5.7 ක වර්ධනයට සාපේක්ෂවය.** ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා වූ නව බඳවා ගැනීම් මෙම වර්ධනයට දායක විය.

**පෞද්ගලික සේවා උප අංශයේ වර්ධනය 2008 දී වාර්තා වූ සියයට 6.5 ට සාපේක්ෂව සියයට 5.8 ක් විය.** සමස්ත ආර්ථිකයේ වූ මන්දගාමී ස්වභාවය මෙම අඩු වීමට හේතු විය.

## 2.3 වියදම

**දේශීය ආර්ථික ක්‍රියාකාරිත්වය මගින් උත්පාදනය කරනු ලබන සමස්ත ඉල්ලුම, ආර්ථිකයෙහි පෞද්ගලික හා රාජ්‍ය අංශයන්හි පරිභෝජන හා ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) වියදම්වල එකතුව වන දළ දේශීය වියදම මගින් මනිනු ලැබේ.** වෙළෙඳපොළ මිල අනුව දළ දේශීය වියදම 2009 වසර තුළ රුපියල් බිලියන 5,139 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, මෙය සියයට 2.5 ක වර්ධනයකි. මේ අතර, 2008 වසර සඳහා දළ දේශීය වියදමේ වර්ධනය 26.9 ක් විය. රට තුළ වූ ගැටුම්කාරී වාතාවරණය නිමා වීමෙන් පසුව, වඩා යහපත් සාර්ව ආර්ථික වටපිටාවක් තුළ ඇති වූ පාරිභෝගික හා ආයෝජක විශ්වාසය වර්ධනය වීමේ

**2.11 සංඛ්‍යා සටහන** **සමස්ත ඉල්ලුම**

රුපියල් මිලියන

| අයිතමය | පවත්නා වෙළෙඳ මිල අනුව 2007 | පවත්නා වෙළෙඳ මිල අනුව 2008(අ) | පවත්නා වෙළෙඳ මිල අනුව 2009(ආ) | 2002 ස්ථාවර මිල අනුව 2007 | 2002 ස්ථාවර මිල අනුව 2008(අ) | 2002 ස්ථාවර මිල අනුව 2009(ආ) |
|---|---|---|---|---|---|---|
| **1. දේශීය ඉල්ලුම** | | | | | | |
| පරිභෝජනය | 2,949,712 | 3,799,084 | 3,955,355 | 1,781,906 | 1,922,875 | 2,002,435 |
| (% වෙනස) | 20.9 | 28.8 | 4.1 | 4.5 | 7.9 | 4.1 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 1,000,323 | 1,215,247 | 1,183,654 | 630,882 | 657,364 | 666,817 |
| (% වෙනස) | 21.7 | 21.5 | -2.6 | 8.0 | 4.2 | 1.4 |
| **මුළු දේශීය ඉල්ලුම** | 3,950,035 | 5,014,331 | 5,139,009 | 2,412,788 | 2,580,240 | 2,669,252 |
| **(% වෙනස)** | 21.1 | 26.9 | 2.5 | 5.4 | 6.9 | 3.4 |
| **2. විදේශීය ඉල්ලුම** | | | | | | |
| භාණ්ඩ සහ සේවා අපනයන | 1,041,932 | 1,095,679 | 1,030,861 | 756,022 | 758,972 | 665,575 |
| (% වෙනස) | 17.7 | 5.2 | -5.9 | 7.3 | 0.4 | -12.3 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 1,413,278 | 1,699,328 | 1,344,785 | 936,154 | 973,711 | 885,523 |
| (% වෙනස) | 16.9 | 20.2 | -20.9 | 3.7 | 4.0 | -9.1 |
| **ශුද්ධ බාහිර ඉල්ලුම** | -371,344 | -603,649 | -313,924 | -180,132 | -214,739 | -219,948 |
| **3. මුළු ඉල්ලුම** | 3,578,688 | 4,410,682 | 4,825,085 | 2,232,656 | 2,365,501 | 2,449,304 |
| (% වෙනස) | 21.8 | 23.2 | 9.4 | 6.8 | 6.0 | 3.5 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රතිඵල, ආර්ථික සංවර්ධනයට උපකාරී වන්නේ යම්කිසි කාල පරාසයකින් පසුව බව වසර තුළ වූ දේශීය ඉල්ලුමේ මන්දගාමීත්වයෙන් පෙන්නුම් කරයි. එමනිසා, ශ්‍රී ලංකාවේ පසුගිය වසර 24 තුළ පැවැති අවම උද්ධමනය 2009 වසරේ දී වාර්තා කිරීම තුළින් පරිභෝජනය සඳහා විශේෂ උනන්දුවක් ඇති විය හැකිව තිබුණ ද, ඉහත සඳහන් කළ කාල පරාසය සහ ලෝක ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස දේශීය ඉල්ලුමේ සැලකිය යුතු ප්‍රසාරණයක් දක්නට නොලැබුණි. සමස්ත මිල මට්ටමේ සැලකිය යුතු පහත වැටීමක් පිළිබිඹු කරමින් දේශීය ඉල්ලුමේ මන්දගාමීත්වය, නාමික වශයෙන් ගත් කළ මූර්ත අගයට වඩා වැඩි ප්‍රමුඛතාවයක් පෙන්නුම් කරයි. දළ දේශීය වියදම සහ ශුද්ධ ආනයනවල එකතුවෙන් ගණනය කරනු ලබන දළ දේශීය නිෂ්පාදිතය වෙළෙඳපොළ මිල මට්ටම අනුව රුපියල් බිලියන 4,825 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, පසුගිය වසර හා සැසඳීමේ දී එය සියයට 9.4 ක වර්ධනයක් පෙන්නුම් කරයි.

## පරිභෝජනය

**රාජ්‍ය සහ පෞද්ගලික අංශවල පරිභෝජන එකතුවෙන් ලැබෙන මුළු පරිභෝජන වියදම (වෙළෙඳපොළ මිල අනුව) රුපියල් බිලියන 3,955 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය පසුගිය වසරේ වූ සියයට 28.8 ක වර්ධනයට සාපේක්ෂව සියයට 4.1 ක වර්ධනයක් විය.** පෞද්ගලික පරිභෝජන වියදම පසුගිය වසරේ වූ සියයට 28.4 ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.6 කින් ආන්තිකව වර්ධනය විය. රාජ්‍ය පරිභෝජනය පසුගිය වසරේ වූ සියයට 30.6 ක වර්ධනයට සාපේක්ෂව සියයට 19.3 ක මන්දගාමී වර්ධනයක් පෙන්විය. දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික පරිභෝජන වියදම, 2008 වසරේ වූ සියයට 70.0 ක අගයක සිට සියයට 64.3 දක්වා පහළ ගිය අතර රාජ්‍ය පරිභෝජනය 2008 වසරේ වූ සියයට 16.2ක අගයක සිට 17.6 දක්වා 2009 වසර තුළ දී ඉහළ ගියේය.

**ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාණ්ඩය මගින් මුළු පෞද්ගලික පරිභෝජන වියදම සඳහා වූ දායකත්වය, 2008 වසරේ වූ සියයට 37.8 හි සිට සියයට 38.2 දක්වා 2009 වසරේ දී ඉහළ ගියේය.** තව ද, ආහාර, පාන වර්ග හා දුම්කොළ සඳහා වූ පෞද්ගලික පරිභෝජන වියදම, 2008 වසරේ වූ සියයට 18.5 ක වර්ධනයට සාපේක්ෂව වර්ධනය වූයේ සියයට 1.7 කිනි. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ ආහාර හා පාන වර්ග කාණ්ඩයේ උප-දර්ශකයට අනුව 2008 වසරේ වූ සියයට 30.5 ක මිල වැඩි වීමට සාපේක්ෂව 2009 දී සියයට 2.8 කින් මිල ඉහළ යෑම මන්දගාමී වීම මෙම කාණ්ඩයේ අඩු වර්ධනයට හේතු විය. රෙදිපිළි හා පාවහන් සඳහා නාමිකව වියදම 2008 වසරේ වූ සියයට 14.2 ක වැඩි වීමට සාපේක්ෂව, 2009 වසර තුළ දී සියයට 1.5 කින් අඩු විය.

**2.12 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළෙඳ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය**

| අයිතමය | මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%) | | | වෙනස්වීමේ අනුපාතය (%) | |
|---|---|---|---|---|---|
| | 2007 | 2008(අ) | 2009(ආ) | 08/07 | 09/08 |
| 1. ආහාර, පාන සහ දුම්කොළ | 41.0 | 37.8 | 38.2 | 18.5 | 1.7 |
| 2. රෙදිපිළි සහ පාවහන් | 6.4 | 5.7 | 5.6 | 14.2 | -1.5 |
| 3. නිවාස කටයුතු, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන | 11.1 | 12.7 | 12.0 | 47.4 | -5.1 |
| 4. ගෘහභාණ්ඩ, ගෘහස්ථ උපකරණ සහ නෛත්‍යක නිවාස නඩත්තුව | 6.2 | 5.8 | 5.9 | 20.0 | 3.1 |
| 5. සෞඛ්‍යය | 1.7 | 1.8 | 2.2 | 40.8 | 20.4 |
| 6. ප්‍රවාහනය | 19.2 | 21.8 | 21.1 | 45.9 | -2.5 |
| 7. විනෝද සේවා සහ සංස්කෘතික කටයුතු | 3.6 | 3.6 | 2.9 | 29.4 | -18.5 |
| 8. අධ්‍යාපනය | 0.1 | 0.1 | 0.1 | 14.2 | 9.4 |
| 9. හෝටල් සහ ආපන ශාලා | 1.6 | 1.5 | 1.5 | 17.9 | 2.3 |
| 10. විවිධ භාණ්ඩ සහ සේවා | 4.2 | 4.9 | 5.5 | 48.7 | 13.9 |
| 11. ශ්‍රී ලාංකිකයින් එතෙරදී කරන වියදම් | 8.9 | 7.7 | 8.1 | 10.5 | 5.9 |
| 12. අඩු කළා : විදේශිකයින් මෙතෙරදී කරන වියදම් | 3.8 | 3.3 | 3.1 | 9.9 | -5.0 |
| **මුළු පෞද්ගලික පරිභෝජන වියදම** | 100.0 | 100.0 | 100.0 | 28.4 | 0.6 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**නිවාස කටයුතු, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන සඳහා නාමික වියදම් ද සියයට 5.1 කින් සංකෝචනය විය.** බොරතෙල් මිල පහත වැටීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය වෙළෙඳපොළේ ඉන්ධන මිල පහළ යාම මෙම සංකෝචනයට හේතු විය.

**පසුගිය වසර තුළ දී සියයට 20.0 කින් පමණ වර්ධනය වූ ගෘහ භාණ්ඩ, ගෘහස්ථ උපකරණ හා සේවාවන් සඳහා නාමික වියදම මෙම වසරේ දී සියයට 3.1 දක්වා මන්දගාමී විය.** මෙම වියදම් කාණ්ඩය සඳහා වූ කොළඹ පරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ උප-දර්ශකය ඉහළ යාම 2008 වසරේ වූ සියයට 14.6 ක අගයට සාපේක්ෂව 2009 වසරේ සියයට 9.1ක අගයක් ගැනීම තුළින් 2009 වසර තුළ දී මිල ඉහළ යාම 2008 වසරට වඩා අඩු වේගයකින් සිදු වී ඇති බව පෙනේ.

**2009 වසර තුළ දී සෞඛ්‍ය සේවා හා අධ්‍යාපනය සඳහා වියදම් පිළිවෙළින් සියයට 20.4 කින් හා සියයට 9.4 කින් ඉහළ ගියේය.** අනෙකුත් සියළුම වියදම් කාණ්ඩයන් හා සැසඳීමේ දී පසුගිය වසරේ මෙන් මුළු වියදම්වල ප්‍රතිශතයක් ලෙස මෙම කාණ්ඩයන්ගේ දායකත්වය අඩු මට්ටමක නොවෙනස්ව පවතී. මුළු වියදම්වලට සෞඛ්‍ය සේවාවල දායකත්වය 2008 වසරේ වූ සියයට 1.8 කට සාපේෂව 2009 වසරේ දී සියයට 2.2 ක් වන අතර අධ්‍යාපන කටයුතු සඳහා වූ වියදම්වල දායකත්වය 2008 හා 2009 යන වසර දෙක තුළ දීම සියයට 0.1 ක් ලෙස නොවෙනස්ව පැවතිණි. රජය මගින් සෞඛ්‍ය සහ අධ්‍යාපන පහසුකම් නොමිලේ පොදු ජනතාවට ලබාදීම මුළු වියදම් සඳහා මෙම කාණ්ඩයන්ගේ අඩු දායකත්වය තුළින් පිළිබිඹු වේ.


**පෙට්‍රල් හා ඩීසල් මිල ගණන් අඩු වීම නිසා ප්‍රවාහන කටයුතුවල පිරිවැය අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස 2008 වසරේ දී සියයට 45.9 ක් වැනි ඉහළ අනුපාතයකින් වර්ධනය වූ ප්‍රවාහන වියදම්, 2009 වසර තුළ දී සියයට 2.5 කින් පහළ ගියේය.** සමස්ත පරිභෝජන වියදම්වල ප්‍රතිශතයක් ලෙස මෙම කාණ්ඩයේ වියදම් සියයට 21.8 සිට සියයට 21.1 දක්වා ආන්තිකව පහත වැටුණි. 2008 වසරේ අවසන් කාර්තුව තුළ දී ඉන්ධන මිල සහ බස් ගාස්තු පහළ අගයකට සංශෝධනය කිරීම 2009 වසර තුළ මෙම කාණ්ඩයේ පරිභෝජන වියදම් තරමක් අඩු වීමට හේතු විය.


**2008 වසර තුළ දී සියයට 30.6 කින් වර්ධනය වූ රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම, 2009 වසර තුළ දී ඉහළ යනු ලැබුවේ සියයට 19.3 කිනි.** මෙම මන්දගාමී බවට හේතු වූයේ දළ දේශීය නිෂ්පාදිතයේ අවධමනකයේ වර්ධනය මගින් පිළිබිඹු වන අඩු උද්ධමන මට්ටමයි.

## ආයෝජනය

**ආයෝජන වියදම (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) වෙළෙඳපොළ මිල අනුව රුපියල් බිලියන 1,184 ක් වේ යයි ඇස්තමේන්තු කර ඇත. මෙය 2008 වසරට සාපේක්ෂව සියයට 2.6 ක නාමික පහත වැටීමකි.** මූර්ත වශයෙන් ආයෝජන වියදම් සියයට 1.4 කින් වර්ධනය වූ අතර 2008 වසර සඳහා වූ මීට අනුරූප වූ

**2.4 රූප සටහන** **අනුමතකළ සහ ගිවිසගත් ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන්හි ආයෝජන**




(අ) පුළුල් කරන ලද ව්‍යාපෘතීන් ඇතුළත් නොවේ
(ආ) මිහින් ලංකා පෞද්ගලික සමාගම සඳහා කරන ලද දේශීය ආයෝජන හැර

වර්ධනය සියයට 4.2 කි. ලෝක ආර්ථික අර්බුදය හමුවේ සමස්ත ආයෝජන පහත වැටීම ආයෝජන වියදම්වල මන්දගාමීත්වයට, යම් තරමකට හේතු විය. ආර්ථිකය මූර්ත වශයෙන් සියයට 3.5 කින් වර්ධනය වුව ද, මුළු ආයෝජනවල මන්දගාමීත්වය හේතුවෙන් ආයෝජන අනුපාතය දළ දේශීය නිෂ්පාදිතයට අනුපාතයක් ලෙස ගත් කල සියයට 24.5 දක්වා ප්‍රතිශත අංක 3.1 කින් පහත වැටිණි.

**රාජ්‍ය සංස්ථාවල ආයෝජන ද ඇතුළත් මුළු ආයෝජනවලින් සියයට 73 ක් වන පුද්ගලික ආයෝජන, 2008 වසරේ පැවැති සියයට 15.1 ක නාමික වර්ධනයට සාපේක්ෂව 2009 වසර තුළ දී සියයට 6.9 කින් අඩු වීමක් පෙන්විය.** සාපේක්ෂව, ආර්ථිකයේ සමහර අංශවල අඩු මූර්ත වර්ධනයක් පැවැතීම, ජාත්‍යන්තර වෙළෙඳාමේ උච්චාවචනයන් සිදු වීම, අභ්‍යන්තර ගැටුම් උත්සන්න වීම නිසා වසරේ පළමු අර්ධයේ අවිනිශ්චිතතාවයක් පැවැතීම සහ ලෝක ආර්ථික අර්බුදයට අනුරූපව ජාත්‍යන්තර ඉල්ලුම මන්දගාමී වීම හේතු කොට ගෙන කර්මාන්තවල අතිරික්ත ධාරිතාවයක් පැවැතීම යන කරුණු පෞද්ගලික ආයෝජන අඩු වීමට හේතු වූවා විය හැක. කෙසේ වුව ද, වසරේ දෙවන අර්ධය තුළ දී පුද්ගලික අංශයේ ණය ගැනීම් ඉහළ යාම විදේශීය සෘජු ආයෝජන ප්‍රවාහයන් ඉහළ යාම සහ ආයෝජන භාණ්ඩ ආනයනය සැලකිය යුතු ලෙස වැඩි වීම තුළින් පෞද්ගලික ආයෝජනවල යහපත් උපනතියක් පෙන්නුම් කෙරේ.

**2009 වසරේ දී විදේශීය සෘජු ආයෝජන (FDI) ලැබීම් 2008 වසර සමග සැසඳීමේ දී සියයට 32 කින් පහළ වැටුණු අතර 2009 වසරේ දී එහි දායකත්වය එ.ජ.ඩොලර් මිලියන 601 ක් විය.** 2009 වසර තුළ දී නිෂ්පාදන අංශයට අයත් රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ උප අංශය, විදේශීය සෘජු ආයෝජන වලින් වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගනිමින් ඉහළ දායකත්වයක් ලබාදෙන ලදි.

**2009 වසරේ දී ආයෝජන මණ්ඩල පනත යටතේ අනුමත කරන ලද ව්‍යාපෘතීන් සංඛ්‍යාව අඩු වුව ද එහි දායකත්වය රුපියල් බිලියන 563 ක් දක්වා සියයට 15.2 කින් වැඩි වී ඇත.** මෙයින් නව ව්‍යාපෘති 129 ක පූර්ණ අයිතිය විදේශීය ආයෝජකයින් සතුව ද, ව්‍යාපෘති 81 ක අයිතිය හවුල් ව්‍යාපාර සතුව ද පැවති අතර ඉතිරිය ශ්‍රී ලාංකීය ආයෝජකයන් සතු විය. 2009 දී ව්‍යාපෘති 22 ක් පුළුල් කිරීම සඳහා අනුමැතිය ලැබූ අතර එහි ආයෝජන වටිනාකම රුපියල් බිලියන 17 ක් විය. ව්‍යාපෘතීන් 255 ක් ආකර්ෂණය කර ගනිමින් සේවා අංශය තවදුරටත් මෙම ආයෝජන සඳහා ප්‍රධාන දායකත්වයක් සැපයූ අතර, ඉතිරිය නිෂ්පාදන අංශය විසින් ආකර්ෂණය කර ගන්නා ලදි. සේවා අංශය යටතේ, ප්‍රධාන දායකයන් වූයේ හෝටල් සහ ආපනශාලා, තොරතුරු තාක්ෂණය සහ පරිගණක මෘදුකාංග සංවර්ධනය, බලශක්ති උත්පාදනය, නිවාස සහ දේපොළ සංවර්ධනය, අධ්‍යාපනික හා පුහුණු ආයතන, වාණිජ කාර්යාල සහ කෘෂිකර්මය ආශ්‍රිත ව්‍යාපෘති යනාදියයි. 2009 වසරේ දී අනුමත කළ ව්‍යාපෘති අතුරින් නිෂ්පාදන අංශය යටතේ, වැඩිප්‍රමාණයකට දායක වූයේ සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ උප අංශයන්ය. 2009 වසර අවසාන වන විට ආයෝජන මණ්ඩලය යටතේ සිදුකර ඇති ආයෝජනවල සමුච්චිත අගය රුපියල් බිලියන 771 ක් විය.

**2009 වසරේ දී ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ගිවිසුම් වලට එළඹි ආයෝජන වල සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය.** 2009 වසරේ දී ගිවිසුම් වලට එළඹි ව්‍යාපෘති 177 න්, 86 ක් සේවා අංශය තුළ වූ අතර, ඒවායේ මුළු ආයෝජන වටිනාකම රුපියල් බිලියන 148 ක් විය. ව්‍යාපෘති 77 ක්

**2.13 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායයන්හි ආයෝජන සහ සේවා නියුක්තිය**

| කාණ්ඩය | ව්‍යාපෘති සංඛ්‍යාව | | ආයෝජන (රු. මිලියන) | | | | | | සේවා නියුක්තිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2008(අ) | | | 2009(ආ) | | | | |
| | 2008(අ) | 2009(ආ) | විදේශීය | දේශීය | එකතුව | විදේශීය | දේශීය | එකතුව | 2008(අ) | 2009(ආ) |
| ආයෝජන මණ්ඩලය (1978 අංක 4 දරණ පනත යටතේ) | | | | | | | | | | |
| අනුමත කළ ව්‍යාපෘති | 502 | 418 | 341,652 | 147,160 | 488,812 | 454,770 | 108,228 | 562,997 | 61,068 | 129,059 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 453 | 380 | 337,927 | 146,145 | 484,072 | 440,878 | 107,672 | 548,550 | 57,718 | 127,230 |
| 16 වන වගන්තිය යටතේ | 49 | 38 | 3,725 | 1,015 | 4,740 | 13,892 | 556 | 14,447 | 3,350 | 1,829 |
| 17 වන වගන්තිය යටතේ ගිවිස ගත් ව්‍යාපෘති (ඇ) | 241 | 177 | 73,938 | 108,359 | 182,297 | 373,957 | 48,495 | 422,452 | 29,711 | 108,195 |
| 17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන (ඈ) | 1,989 | 1,922 | 440,408 | 261,416 | 701,824 | 494,461 | 276,732 | 771,193 | 458,165 | 474,128 |
| වාණිජ කටයුතුවල නිරත වූ (ඈ) | 2,557 | 2,490 | 242,222 | 3,885,067 | 4,127,289 | 258,643 | 3,889,782 | 4,148,425 | 392,509 | 381,424 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) (ඈ) | 1,767 | 1,726 | 224,513 | 3,875,028 | 4,099,541 | 240,271 | 3,879,874 | 4,120,145 | 357,844 | 346,536 |
| 16 වන වගන්තිය යටතේ (ඈ) | 790 | 764 | 17,709 | 10,039 | 27,748 | 18,372 | 9,908 | 28,280 | 34,665 | 34,888 |
| කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | | | | | | | | | | |
| ලියාපදිංචි වූ ව්‍යාපෘති (ඈ) | 1,751 | 1,876 | ලැ.නො. | ලැ.නො. | 130,357 | ලැ.නො. | ලැ.නො. | 139,120 | 282,706 | 292,168 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පුළුල් කළ ව්‍යාපෘතීන් ද ඇතුළත්ව
(ඈ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

නිෂ්පාදන අංශයේ වූ අතර එහි ආයෝජන වටිනාකම රුපියල් බිලියන 259 ක් වූ අතර ඉතිරි ව්‍යාපෘති 14 පුළුල් කිරීම සඳහා විය. සකස්කළ ලෝහ නිෂ්පාදිත සහ ප්‍රවාහන උපකරණ උප අංශය 2009 වර්ෂයේ දී ගිවිසුම්වලට එළඹි ආයෝජන වලින් සියයට 55 ට වැඩි ප්‍රමාණයකට දායක විය.

**2009 වසරේ දී වෙළෙඳ කටයුතු ආරම්භ කළ ආයෝජන මණ්ඩල කර්මාන්තවල සමුච්චිත ආයෝජන දායකත්වය සියයට 0.5 ක පමණ ආන්තික වර්ධනයක් පෙන්වීය.** එයින්, 2009 අවසානය වන විට දේශීය ආයෝජකයින් සතු ආයෝජන දායකත්වය සියයට 94 ක් විය. 2009 වසර අවසාන වන විට ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අපනයන සැකසුම් කලාප සහ කර්මාන්තපුර වලින් පිටත ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද නව ව්‍යාපෘති සංඛ්‍යාව 1,349 ක් විය.

**2009 වසර අවසානයේ දී, කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසාය සංඛ්‍යාව 1,876 ක් දක්වා 2009 වසරේ දී වර්ධනය වූ අතර, එහි ආයෝජන දායකත්වය රුපියල් බිලියන 139 කි.** කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති ව්‍යවසායයන්ගෙන් සියයට 80 කට වඩා වැඩි ප්‍රමාණයක් කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක වල පිහිටා ඇති අතර, එමඟින් සමස්ත ආයෝජන වලට සියයට 90 කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා දායකත්වය සපයා ඇත. ලියාපදිංචි මුළු ආයෝජන වටිනාකමෙන් සියයට 65 ක් පමණ එනම් රුපියල් බිලියන 90 ක් ආහාර, පානවර්ග සහ දුම්කොළ නිෂ්පාදිත, රසායන ද්‍රව්‍ය, ඛනිජ තෙල්, ගල් අඟුරු, රබර් සහ ප්ලාස්ටික් භාණ්ඩ සහ රෙදිපිළි, ඇඟළුම් සහ සම් භාණ්ඩ කර්මාන්තවල ව්‍යවසායයන් විසින් ආකර්ෂණය කරගෙන ඇත.

**ඉහළ පාදක අගයක් තිබියදීත් (පසුගිය වසරේ වර්ධනය සියයට 48 ක් හේතුවෙන්) රාජ්‍ය ආයෝජනවල නාමික වශයෙන් සියයට 11.3 ක මධ්‍යස්ථ වශයෙන් වර්ධනයක් පැවැතීමෙන්, රාජ්‍ය ආයෝජන හා දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය 2008 වසරේ පැවැති සියයට 6.5 සිට, සියයට 6.6 දක්වා ආන්තික වර්ධනයක් 2009 වසරේ දී පෙන්නුම් කළේය.** පසුගිය වසරේ මෙන්ම, මෙම වසරේ දී ද රජය අඛණ්ඩව ආයෝජන කටයුතුවල නිරත වූ අතර විශේෂයෙන්ම "උතුරු වසන්තය" හා "නැගෙනහිර නවෝදය" ඇතුළු මෑතක දී මුදාගත් උතුරු නැගෙනහිර ප්‍රදේශවල ජීවන මට්ටම නැංවීමෙහිලා යොමු වූ වැඩසටහන් ද ඇතුළුව ප්‍රධාන වශයෙන් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන් රාශියක් ක්‍රියාවට නංවන ලදි.

### පවත්නා සම්පත් සහ උපයෝජනය

**ද.දේ.නි. (දේශීය සම්පත්) සහ භාණ්ඩ හා සේවා ආනයන (විදේශීය සම්පත්) මගින් නිර්ණය කරනු ලබන ආර්ථිකයේ පවත්නා සමස්ත සම්පත් ප්‍රමාණය 2009 වසර තුළ දී රුපියල් බිලියන 6,170 දක්වා සියයට 1.0 කින් පමණ වැඩි විය.** මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට

**2.14 සංඛ්‍යා සටහන** — **සම්පත් සංයුතිය සහ උපයෝජනය (පවත්නා වෙළෙඳ මිල අනුව)**

| අයිතමය | ප්‍රතිශතාත්මක දායකත්වය | | ප්‍රතිශතාත්මක වර්ධනය | |
|---|---|---|---|---|
| | 2008 (අ) | 2009(ආ) | 2008(අ) | 2009(ආ) |
| **1. සම්පත්** | | | | |
| වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 72.2 | 78.2 | 23.2 | 9.4 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 27.8 | 21.8 | 20.2 | -20.9 |
| **එකතුව** | 100.0 | 100.0 | 22.4 | 1.0 |
| **2. උපයෝජනය** | | | | |
| පරිභෝජනය | 62.2 | 64.1 | 28.8 | 4.1 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 18.3 | 18.6 | 26.1 | 2.9 |
| පෞද්ගලික | 14.0 | 13.6 | 19.4 | -1.7 |
| රජය | 4.3 | 5.0 | 53.9 | 17.6 |
| තොග වෙනස්වීම් | 1.6 | 0.6 | -13.6 | -63.8 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 17.9 | 16.7 | 5.2 | -5.9 |
| **එකතුව** | 100.0 | 100.0 | 22.4 | 1.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

78.2 ක් වන රුපියල් බිලියන 4,825 ක් දේශීය සම්පත් වන අතර, මුළු සම්පත් ප්‍රමාණයෙන් සියයට 21.8 ක් වන රුපියල් බිලියන 1,345 ක් විදේශීය සම්පත් වේ. 2009 වසර තුළ දී දේශීය සම්පත්වල සියයට 9.4 ක වර්ධනයට අනුරූපව විදේශීය සම්පත් සියයට 20.9 කින් ඉහළ ගියේය. පවත්නා සමස්ත සම්පත් ප්‍රමාණය මූර්ත වශයෙන් සියයට 0.1 කින් පමණ පහත වැටීමට හේතු වූයේ අඩු මූර්ත ආර්ථික වර්ධනයක් පැවැතීම සහ ආනයනික භාණ්ඩ හා සේවාවන් පහත වැටීමයි.


වසරේ සම්පත් උපයෝජනය සලකා බලන විට, පරිභෝජන ප්‍රතිශතය 2008 වසරේ වූ සියයට 62.2 ක අගයක සිට සියයට 64.1 දක්වා ඉහළ ගිය අතර, මෙය සියයට 4.1ක වර්ධනයකි (2008 වසරේ දී වර්ධනය සියයට 28.8 ක් විය). මේ සමඟම දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ ප්‍රතිශතය සියයට 18.3 සිට 18.6 දක්වා ආන්තිකව ඉහළ යමින් සියයට 2.9 ක මූර්ත වර්ධනයක් පෙන්නුම් කළේය (2008 වසරේ දී ආයෝජනවල වර්ධනය සියයට 26.1 ක් විය). තව ද, භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන සියයට 5.9 කින් පහත වැටුණු අතර, එය මුළු සම්පත් උපයෝජනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 16.7 දක්වා සියයට 1.2 කින් පහත වැටීමෙන් පරිභෝජනවල සිදු වූ වර්ධනය පිළිබිඹු කරන ලදී.

දේශීය වෙළෙඳ, බැංකු, රක්ෂණ, දේපළ වෙළෙඳාම් සහ ප්‍රවාහන හා සන්නිවේදන උප අංශයන්ගේ සැලකිය යුතු දායකත්වය සමඟ දේශීය සේවාවන් සමස්ත සැපයුමෙන් සියයට 45.1 ට දායක වෙමින් දේශීය භාණ්ඩ සැපයුම අභිබවාලීය. පසුගිය වසරට සාපේක්ෂව දේශීය සේවා සහ භාණ්ඩ සැපයුම 2009 වසර තුළ දී පිළිවෙලින් සියයට 10.2 කින් හා 8.3 කින් පුළුල් විය. සමස්ත සැපයුමේ ප්‍රතිශතයක් ලෙස ආනයනික භාණ්ඩ 2008 වසරේ වූ සියයට 25.0 ක අගයක සිට 2009 වසරේ දී සියයට 19.0 දක්වා අඩු විය. කෙසේ නමුත්, සමස්ත සැපයුමේ ප්‍රතිශතයක් ලෙස ආනයනික සේවාවන් පසුගිය වසරේ මෙන් සියයට 2.8ක ප්‍රතිශතයක පැවතිණි.


සමස්ත ඉල්ලුම සලකා බැලූ විට ආයෝජනවල නාමික අගයේ ප්‍රතිශතය සියයට 64.1 ක් ද, ප්‍රාග්ධන සම්පාදනය සියයට 19.2 ක් ද සහ අපනයන සියයට 16.7 ක් ද විය. පෞද්ගලික අංශය විසින් මුළු දේශීය ඉල්ලුමෙහි පරිභෝජනවලින් සියයට 78 ක් සඳහා ද, ආයෝජනවලින් සියයට 73 ක් සඳහා ද දායක වී ඇත. රාජ්‍ය අංශයේ ආයෝජන සහ පරිභෝජනවල සැලකිය යුතු පුළුල් වීම සමඟ මෙම ප්‍රතිශතයන් පසුගිය වසරට වඩා අඩු වී ඇත.

**2.5 රූප සටහන** — **2009 වර්ෂයේ ආර්ථිකය (පවත්නා මිල යටතේ)**

**භාණ්ඩ සහ සේවා සැපයුම**




**භාණ්ඩ සහ සේවා සඳහා ඉල්ලුම**
**(රුපියල් බිලියන 6,170)**



**2.15 සංඛ්‍යා සටහන** **පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළෙඳ මිල අනුව)**

| අයිතමය | රුපියල් මිලියන | | ප්‍රතිශතක වෙනස | | ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2008(අ) | 2009(ආ) | 2008(අ) | 2009(ආ) | 2008(අ) | 2009(ආ) |
| 1. වෙළෙඳ මිල අනුව ද.දේ.නි. | 4,410,682 | 4,825,085 | 23.2 | 9.4 | 100.0 | 100.0 |
| 2. පරිභෝජන වියදම | 3,799,084 | 3,955,355 | 28.8 | 4.1 | 86.1 | 82.0 |
| පෞද්ගලික | 3,085,296 | 3,103,806 | 28.4 | 0.6 | 70.0 | 64.3 |
| රජය | 713,788 | 851,549 | 30.6 | 19.3 | 16.2 | 17.6 |
| 3. ආයෝජන | 1,215,247 | 1,183,654 | 21.5 | -2.6 | 27.6 | 24.5 |
| පෞද්ගලික | 929,115 | 865,077 | 15.1 | -6.9 | 21.1 | 17.9 |
| රජය | 286,132 | 318,577 | 48.3 | 11.3 | 6.5 | 6.6 |
| 4. දේශීය ඉතුරුම් | 611,598 | 869,730 | -2.8 | 42.2 | 13.9 | 18.0 |
| පෞද්ගලික | 700,048 | 1,046,661 | 1.9 | 49.5 | 15.9 | 21.7 |
| රජය | -88,450 | -176.931 | -53.3 | -100.0 | -2.0 | -3.7 |
| 5. දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය | -603,649 | -313,924 | -62.6 | 48.0 | -13.7 | -6.5 |
| 6. විදේශීය ශුද්ධ සාධක ආදායම | -105,031 | -55,814 | -168.9 | 46.9 | -2.4 | -1.2 |
| 7. විදේශීය ශුද්ධ පෞද්ගලික වර්තන සංක්‍රාම | 277,711 | 336,578 | 13.3 | 21.2 | 6.3 | 7.0 |
| 8. ජාතික ඉතුරුම් | 784,278 | 1,150,494 | -6.1 | 46.7 | 17.8 | 23.9 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## ඉතුරුම්

විශේෂයෙන්ම, ලෝක ආර්ථික අර්බුදයෙන් පසුව වෙළෙඳ භාණ්ඩවල සාපේක්ෂ අඩු මිල ගණන් පැවැතීමේ ප්‍රතිඵලයක් ලෙස ආයෝජන වියදමේ මන්දගාමී වර්ධනය හේතුවෙන් දේශීය ඉතුරුම් හා ජාතික ඉතුරුම් 2008 වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස වර්ධනය විය. මේ හේතුවෙන් සම්පත් පරතරය, එනම් ද.දේ.නි.හි අනුපාතයක් ලෙස, දේශීය ඉතුරුම් හා ආයෝජන අතර වෙනස 2008 වසරේ වාර්තා වූ සියයට 13.7 ක අගය හා සැසඳීමේ දී එම අගය 2009 වසරේ දී සියයට 6.5 ක අගයක පැවතිණි. තව ද, සම්පත් පරතරය අඩු වීම, ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමේ හිඟයේ හිතකර තත්ත්වය හා අනුරූප විය.

2009 වසර සඳහා පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයෙහිම ඉතුරුම් ඇතුළත් වන දේශීය ඉතුරුම් ප්‍රමාණය රුපියල් බිලියන 870 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය පසුගිය වසර හා සැසඳීමේ දී සියයට 42.2 ක වැඩි වීමකි. දේශීය ඉතුරුම් ඉහළ යාමට මූලික වශයෙන්ම හේතු වූයේ වසර තුළ දී පෞද්ගලික ඉතුරුම්වල වර්ධනයයි. පෞද්ගලික ඉතුරුම් සියයට 49.5 කින් වර්ධනය වූ අතර රාජ්‍ය අයවැයෙහි ජංගම ගිණුමේ ශේෂය වන රාජ්‍ය ඉතුරුම් සෘණ අගයක් ලෙස පවතිමින් තවදුරටත් පිරිහීමකට ලක් වූ අතර, 2008 වසරට සාපේක්ෂව සියයට 100.0 කින් වර්ධනයක් පෙන්විය.

දේශීය ඉතුරුම්, විදේශීය ශුද්ධ සාධක ආදායම හා විදේශීය ශුද්ධ සංක්‍රාම එකතුවෙන් සැදුම්ලත් ජාතික ඉතුරුම්, 2009 වසර සඳහා රුපියල් බිලියන 1,150 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර මෙය පසුගිය වසර හා සැසඳීමේ දී සියයට 46.7 ක වැඩි වීමකි. ජාතික ඉතුරුම් අනුපාතය (ජාතික ඉතුරුම්/ද.දේ.නි.) 2009 වසර තුළ දී ප්‍රතිශත අංක 6.1 කින් සියයට 23.9 ක් දක්වා ඉහළ ගියේය. විදේශීය ශුද්ධ සාධක ආදායම හා විදේශීය ශුද්ධ සංක්‍රාම යන දෙකෙහිම යහපත් ක්‍රියාකාරිත්වය ජාතික ඉතුරුම්වල වර්ධනයට හේතු විය. විදේශීය ශුද්ධ සාධක ආදායම තවදුරටත් සෘණ අගයක් ගන්නා නමුත් වසර තුළ දී සාධක ගෙවීම් පහත වැටීමත් සමඟ එය වැඩිදියුණු විය. 2009 වසර තුළ දී විදේශීය රැකියා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ද අයත්වන ශුද්ධ පෞද්ගලික සංක්‍රාම රුපියල් බිලියන 337 දක්වා සියයට 21.2 කින් ඉහළ ගියේය.